

# පට්ඨාන ධම්මෝ චිරං තිට්ඨතු



# පට්ඨාන ධම්මෝ චිරං තිට්ඨතු

මම පට්ඨාන ධර්මයට ලැදි එම ධර්ම දේශනා නිතර ශ්‍රවණය කරන විශ්‍රාමික ගුරුවරියක්. සමන්ත පට්ඨාන ප්‍රකරණය පිළිබඳ දැනුමක් මට තිබුනේම නැහැ. ඒ පිළිබඳව අවබෝධයක් මට ලැබුනේ කිරිවත්තුඩුවේ අරියදස්සක හිමිපානන්ගේ පට්ඨාන දේශනා ශ්‍රවණය කිරීමෙන් පසුවයි. එම දේශනා අසත්ම අසත්ම එම දේශනා ඇසීමේ රුචිය වර්ධනය වුනා. 'අන්තර් ජාල' දේශනා පවා ශ්‍රවණය කලා. මේසා ගම්භීර ධර්මයක් ශ්‍රවණය කිරීමට යම් තරමකින් හෝ අවබෝධ කර ගැනීමට අපට හැකියාව ලැබුනා. සසරේ අපත් බොහෝ පිංකම් කර ඇති බවත් හැඟුනා. උන්වහන්සේට මේ අත් භවයේම චතුරාර්ය සත්‍ය අවබෝධ වේවා. උන්වහන්සේට ධර්මඥාණය ලබාදෙන දෙනියායේ උපසම ස්වාමීන් වහන්සේ ඇතුළු සංඝ පීතෘන් වහන්සේලාටද පට්ඨාන ධර්ම කාමීන්ගේ නමස්කාරය වේවා. චතුරාර්ය සත්‍ය අවබෝධ වේවා.

ඉන්පසුව රුවන්වැලි සෑමලුවේ තපෝවනයේ රතන ස්වාමීන් වහන්සේ විසින් පවත්වන ලද ධර්ම දේශනාද ශ්‍රවණය කලා. 'පට්ඨාන ධර්මය' පිළිබඳව ධර්ම ග්‍රන්ථ පවා ලබාගත්තා. උන්වහන්සේටද මේ අත්භවයේම චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ වේවා. එම ධර්ම ග්‍රන්ථ ලබාදීමට දායක වූද එවැනි පිංකම් සංවිධානය කළ පින්වතුන්ටද ධර්මාවබෝධය ලැබේවා එසේම කොත්මලේ කුමාර කාශ්‍යප හිමි, තලගල සුධීර හිමි, පරගස්තොට සුධම්ම හිමි, ඉලුකේවිල අත්ථදස්සි හිමි යන සංඝ පීතෘවරුන් වහන්සේලාගේද පට්ඨාන ධර්ම දේශනා ශ්‍රවණය කරනවා. උන්වහන්සේලාටද මේ භවයේම චතුරාර්ය සත්‍ය අවබෝධ වේවා. පට්ඨාන දේශනා අසන අසන විට මට හිතුනා මේ ප්‍රත්‍ය පටිච්ච සමුප්පාදයට පංචස්කන්ධයට ගළපාගන්නේ කොහොමද කියලා. සංඝ පීතෘන්වහන්සේලා එම කරුණු අපට පැහැදිලි කරාවි. පට්ඨානය පිළිබඳ දැඩි ඇල්ම නිසාම මම පට්ඨාන ධර්මය පිළිබඳ පොත් පත් මිලදී ගත්තා. නාරාහේන්පිට 'පට්ඨාන ධර්ම සභාව' පිළිබඳ විස්තර ඇතුළත් පොතක් මගේ පොඩි අම්මාගේ ධර්ම ග්‍රන්ථ අතර තිබී හමුවුනා. එම ධර්ම සභාවට ගොස් පූජ්‍ය වනවාසී යාගොඩ ධර්මප්‍රභා හිමිපාණන්ගේ සහ උන්වහන්සේගේ ශිෂ්‍ය පූජ්‍ය කොරතොට වෙස්සභූ හිමිපාණන් විසින් ලියන ලද පොත් මිලදී ගත්තා. මෙවැනි පොතක් ලියා ඔබලා දැනුවත් කිරීමට එම පොත්ද මට මහෝපකාරී වුනා. එම සංඝ පීතෘන් වහන්සේලාටද මේ භවයේදීම චතුරාර්ය සත්‍ය අවබෝධ වේවා.

බොහෝ කලක සිට දිනකට ධර්ම දේශනා තුන හතරක් පමණ ශ්‍රවණය කරමි. රූපවාහිනියේ විවිධ නාලිකා වල ධර්ම දේශනා පවත්වන හසලක සීලවිමල හිමි, තලල්ලේ චන්ද කිත්ති හිමි, තපෝවනයේ අරියධජ හිමි, මිරිස්සේ ධම්මික හිමි,

බලංගොඩ රාධ හිමි, කෝරලයාගම සරණතිස්ස හිමි, මිරහවත්තේ ප්‍රඥාසිරි වැනි තවත් බොහෝ ස්වාමීන් වහන්සේලාගේ ධර්ම දේශනා වලට සවන් දෙමි. එම සංඝපීතෘන්ලා නිසා වර්තමානයේ බොහෝ දෙනකු සමථ විදර්ශනා භාවනා වැඩීමටද යොමුවී සිටිති. උන්වහන්සේලාටද මේ භවයේම චතුරාර්ය සත්‍ය අවබෝධ වේවා.

මේ පුණ්‍ය මහිමයෙන් බුදුහද මඬලෙහි උපන් අරි අටඟ මගෙහි පියමං කිරීමට මට හැකියාව ලැබේවා. මාගේ මේ උත්සාහය පට්ඨාන ධර්මකාමීන්ට ශක්තියක් වේවා. පට්ඨාන ධර්මය ශ්‍රී ලංකාව පුරාම ව්‍යාප්ත වේවා. එරංග, ගයාන්, පියුමි, යදීෂ, සුලෝචනා, විනුක්, යෙනාරා දරු මුනුබුරන්ටත් දයානන්ද මාගේ ස්වාමි පුරුෂයාටත් නංගිලා මල්ලිලා සහ දූ දරු මුනුබුරු බිරියන්ටත් ත්‍රිවිධරත්නයේ ආරක්ෂාව සැලසේවා. එමෙන් කුඩා කළ සිට මා හට උසස් අධ්‍යාපනය දක්වා ශිල්ප ලබාදුන් කෙසෙල් හේනාවේ මිස්, සේනාධීර මිස්, කාන්ති මිස්, රම්‍යා ෆොන්සේකා මිස්, ජී. ජේ. පෙරේරා සර්, මුණසිංහ සර්, ප්‍රේමදාස මුදුන්කොටුව සර්, සරත් සර්, උඩවත්ත සර්, වේල්ස් කුමාර සර්, ගුණසේකර සර්, රෝහණ තිස්ස සිල්වා සර්, බෙරගම අමිති හිමි, සංඝරාජ වජිරඤාණ හිමි, බමුණුසිංහ මිස්, පෙරේරා සර් යන ගුරුභවතුන්ට මේ පින අනුමෝදන් කරමි. චතුරාර්ය සත්‍ය අවබෝධ වේවා.

එසේම මීට වසර 20 කට පෙර මිය ගිය මාගේ උඩුවර කේ. සී. ද සිල්වා පියතුමාට, විශ්‍රාමික ආචාරිණී ජේ. ආර්. පෙරේරා මවටද දහම් මාවතේ ගමන් කිරීමට මට මඟ පෙන්නූ අපගේ දෙවන මව වූ ජේ. ජේ. පෙරේරා පොඩි අම්මාට මල්ලිලා දෙදෙනාට ලැනන් කවිරත්න පියා, මව ඇතුළු එම පවුලේ මියගිය ඥාතීන්ට සහ අප පවුලේ මියගිය සියලු ඥාතීන්ට මේ පින අත්වේවා. චතුරාර්ය සත්‍ය අවබෝධ වේවා.

මේ සියලුම ධර්මඥානය භාග්‍යවතුන් වහන්සේගේමය. එම දහම් කරුණු සැරියුත් මුගලන් ආදී මහා තෙරවරුන් ප්‍රමුඛ මහා සංඝය වහන්සේලා විසින් පවත්වා ගෙන එන ලදී. මොග්ගලී පුත්ත තිස්ස තෙරුන් මූලිකත්වය ගෙන තුන්වන ධර්ම සංගායනාව පවත්වා එහි ප්‍රතිඵලයක් ලෙස අප දිවයිනට වැඩමවා වදාළා වූ මහින්ද, ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල ආදී මහරහතන් වහන්සේලා ථේරවාදී බුදුදහමේ පොත්පත් අප රටට ගෙනවිත් සුපිරිසිදු බුදුදහම අප රටට දායාද කළහ.

පට්ඨාන ධර්මය දේශනා කරන සියලුම ස්වාමීන් වහන්සේලාට ත්‍රිවිධ රත්නයේ ආරක්ෂාව සහ දෙව් රැකවරණය සැලසේවා. පට්ඨාන දහමට ලැදි පින්වතුන්ටද ත්‍රිවිධ රත්නයේ ආරක්ෂාව හා දෙව් රැකවරණය සැලසේවා.

**- පට්ඨාන ධම්මෝ චිරං තිට්ඨතු -**

**විශ්‍රාමික ආචාරිණී කේ. චින්තා දමයන්ති**
**2025.06.10**

**දුරකථන අංක - 034 2220370**
**'153'**
**සමඟිපුර පාර,**
**කුඩා වස්කඩුව.**

**ආශ්‍රිත ග්‍රන්ථ**

අභිධර්ම මාර්ගය
අභිධර්මයේ මූලික කරුණු } රේරුකානේ චන්ද්‍රවිමල හිමි

මහා පට්ඨාන ප්‍රකරණ ධර්මය - තපෝවනයේ රතන හිමිපාණෝ

පට්ඨාන දේශනා සාරය - පූජ්‍ය වනවාසී යාගොඩ ධර්මප්‍රභ හිමිපාණෝ

පට්ඨාන නිද්දේසපාළි දේශනා - කොරතොට වස්සභූ හිමිපාණෝ

සූවිසි පට්ඨාන පිරිත සහ පට්ඨාන පූජාව - පරගස්තොට සුධම්ම හිමිපාණෝ

පට්ඨාන දේශනා රූපවාහිනිය සහ අන්තර්ජාල දේශනා } කිරිවත්තුඩුවේ අරියදස්සන හිමිපාණෝ
දෙනියායේ උපසම හිමිපාණෝ

# ත්‍රිවිධ රත්නයට මාගේ නමස්කාරය වේවා !

භාග්‍යවතුන් වහන්සේ වසර හතළිස් පහක් පුරාවට දේශනා කළ නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය අතර මුදුන් මල්කඩ වන්නේද ශ්‍රී සම්මා සම්බුද්ධ ශාසනයෙහි හදවත බඳු වන්නේද මේ පට්ඨාන ධර්මයයි. මේ ධර්මය මුලින්ම දේශනා කළේ මාතෘ දිව්‍ය රාජයා ප්‍රමුඛ දෙවිවරුන්ටය.

තව්තිසා දෙව්ලොව දෙවියන්ට මෙම සුවිශේෂී වූ ධර්මය දේශනා කරමියි සිතා බුදුන් වහන්සේ සත්වන වස ගණ්ඩබ්බ රුකමුලදී තීර්ථක මානය බිඳීමට යමාමහ පෙළහර දක්වා ඔවුන් දමනය කොට මිනිස් ලොව සිට තුන් පියවරක් තබා දෙවුලොවට වැඩියහ.

බුදුන් වහන්සේ තම පුරයට වැඩම කළ බව දැනගත් සක්දෙවිඳු තමාගේ ඒක පුණ්ඩරික නම් උයන මැද පිහිටි සියක් යොදුන් උස ඇති පරසතු මදාරා ගස මුල සැටයොදුන් උස පඬුපුල් අසුන බුදුන් වහන්සේට අසුන් ගැනීමට සුදුසු යයි සිතා දිව්‍ය සේනාව ගෙන මහත්වූ පූජා පවත්වමින් බුදුන් එන පෙරමඟට ගොස් බුදුන් වැඩමවා ගෙනවුත් එම අසුන පිළිගැන්වූහ.

බුදුන් වහන්සේ ශක්‍ර පුරයට වැඩි බව ඇසූ මාතෘ දිව්‍ය රාජයා මපුතණුවන් වහන්සේ අද දහම් අමා වැස්සක් වස්සවන සේක. එහි රස බලම්හයි තුන්ගවු උස දිව්‍ය ශරීරයකින් හා ඉතා උසැති මිණි ඔටුන්නකින් හා දිව්‍යාභරණයෙන් සැරසී දිව නළු පිරිස් පිරිවරා සියලු දෙවියන්ගේ ශරීර ප්‍රභා නිශ්ප්‍රභා කරමින් සියලු දිව්‍ය සේනාවට පළමු බුදුන්ගේ දක්ෂිණ දිශාවෙන් දොහොත් මුදුන් දී අසුන් ගත්හ. දෙව්ලොව මහේශාක්‍ය අල්පේශාක්‍ය ආදී දෙවිවරුද බ්‍රහ්මලෝකයෙන් පැමිණි බ්‍රහ්මයෝද රැස්වූහ. බුදුන් වහන්සේගේ සවනක් බුදුරැස් දෙවුලොව පුරා විහිදෙන්නට විය. මාතෘ දිව්‍ය රාජයා ඇතුළු සියලු දිව්‍ය සේනාව දොහොත් මුදුන් දී ගෙන 'ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස බුද්ධාන්තරයක් මුළුල්ලෙහි සැඟවී තිබූ අභිධර්මය දේශනා කරනු මැනවි'' නුඹ වහන්සේ බුදු වූ දින සිට අභිධර්ම අමෘතය අපට ලබා දෙන්නේ කවදාදෝහෝයි දෙව් පිරිස් බලා සිටිති. සියලු දෙවියන්ට විජම් බණ (අභිධර්මය) දේශනා කළ මැනවැයි ආරාධනා කළහ.

එකල්හි බුදුන් වහන්සේ දස එකඩ මසක් තමා කුසින් උසුලා සිටි මෑණියන් වහන්සේ එනම් මාතෘ දිව්‍ය රාජයා ඇතුළු සියලු දෙවියන්ගේ ගත සිත පුබුදුවමින් අභිධර්ම දේශනාව පටන් ගත්හ. පළමු අවස්ථාවෙහි බුදුන් වහන්සේ සරල ලෙස දේශනා කරත්ම. දෙවියෝ අපි අභිධර්මය ඉතා ගම්භීරයයි සිතා සිටියෙමු. එසේ ගැඹුරු නැතැයි සිතන්නාහ. එවිට බුදුන් වහන්සේ අභිධර්මය ගම්භීර ලෙස දේශනා කරන්නාහ. දෙවියන්ට තේරුම් ගැනීමට අපහසු තැන්හි දී සරල ලෙස දේශනා කරන සේක. භාග්‍යවතුන් වහන්සේ දානය වැළඳුව මනා වේලෙහි පඬුපුල්

අසුනෙහි නිර්මිත බුදුරුවක් මවා බුදුන් වහන්සේ දේශනා කරන ලෙසට දේශනා කරත්වයි අදිටන් කොට හිමාල පර්වතයට බැස අනවතප්ත විලේ බුදුන් වහන්සේලාටම නියමිතව තිබෙන සුගත් නම් මහ තොටට බැස මුව දෝවනය කොට රත්ගල් තලා මුදුනෙහි කෙළවර පිහිටි සත්යොදුන් මහ සල්ගස මුල වැඩ සිටි කල්හි ශ්‍රී හස්තයට බස්නා පිරුණු දිව්‍යමය ආහාර ඇති පාත්‍ර ධාතුව පිළිගෙන එහි සිටම දානය වළඳා වැඩ සිටිසේක.

මේ දිනවල සැරියුත් තෙරණුවෝ වග්ගුලි නම් තෙරුන් වහන්සේලා සමග සංකස්ස පුරයෙහි වස් වසන සේක් බුදුන් වහන්සේ වැඩ වසනා ස්ථානය දැන එම ස්ථානයට වැඩම කර බුදුන් වහන්සේ දානය වැළඳූ පාත්‍රය සෝදා කළමනා වත් පිළිවෙත් කර බුදුන් වැඳ එකත්පස්ව හිඳ ස්වාමීනි ඊයේ ඔබ වහන්සේ දේශනා කරන ලද දේශනා හා නිර්මිත බුදුන් වහන්සේ දේශනා කරන ලද දේශනා මටද වදාළ මැනවැයි ආරාධනා කළසේක.

''ශාරිපුත්‍රය මම ඒ ධර්මය නුඹට කෙටියෙන් පවසමි. නුඹ එය විස්තර වශයෙන් දරාගත යුතුය.'' යයි පවසා එම සියලු ධර්ම කොටස් කෙටියෙන් සාරිපුත්‍ර තෙරුන්ට දේශනා කළසේක. බුදුන් වහන්සේ කෙටිව කළ එම ධර්ම දේශනා සැරියුත් තෙරණුවෝ ඉතා ප්‍රඥාවන්ත බැවින් විශේෂයෙන්ම දරා ගන්නා සේක. අනතුරුව බුදුන් වහන්සේ ''ශාරිපුත්‍රය නුඹ ඉගෙන ගත් අභිධර්ම දේශනා තා සමීපයේ සිටින වග්ගුලි මහණුන්ට උගන්නව. ඔවුන් අප ඇවෑමෙන් සප්ත ප්‍රකරණ ආචාරිනී වන්නෝ'' යයි වදාරා දෙවුලෝ වැඩ නිර්මිත බුදුන් ඉවත් කොට අභිධර්ම දේශනාව පවත්වන සේක.

සැරියුත් තෙරණුවෝ වග්ගුලි තෙරුන් හමුවී ''ඇවැත්නි අපගේ භාග්‍යවතුන් වහන්සේ තේරුම් ගැනීමට අපහසු වූ අභිධර්ම නම් දේශනාවක් දෙවුලොව දෙවියන්ට දේශනා කරති. මම දිනෙන් දින එම දේශනා ඉගෙන එමි. තෙපි හැම දෙනද දවසින් දවස මා අතින් උගනිවු. ඉගෙන අවශේෂ භික්ෂූන් හට විජම් පිටකයේ ආචාරීන් ලෙස උගන්නව.'' කියා හැම දිනකම සැරියුත් තෙරණුවෝ බුදුන් වහන්සේ හමුවට ගොස් අභිධර්මය ඉගෙන ගෙන එම තෙරවරුන්ට ඉගැන්වූ සේක. අභිධර්මය ඉගෙන ගැනීම අවසන් වෙත්ම එම පිරිස රහත් භාවයට පත්වූහ.

මේ පිරිස ඉතා බුද්ධිමත් පිරිසක් වූයේ පෙර පින් බලයකිනි. කාශ්‍යප බුදුන් සමයෙහි භික්ෂූන් පිරිසක් අභිධර්ම පිටකය <u>වනපොත්</u> කරති. (කටපාඩම්) අසල ගසක වසා සිටි කිරි වවුලෝ පන්සියයක් පමණ එය සාවදානව අසා සිටිති. කිරි වවුලෝ පිරිස මියගොස් දෙව්ලොව උපන්හ. මේ පිරිස බුද්ධාන්තරයක් දෙව්ලොව

සැප විඳ අප බුදුන් සමයෙහි දෙව්ලොවින් චුතව පන්සියයක් කුලවල ඉපිද පෙර එකට සිටියාක් මෙන් මිත්‍රව අප බුදුන් තීර්ථකයක් දමනය කිරීමට යමාමහ පෙළහර පෑ අවස්ථාවේ බුදුන් කෙරේ පැහැද සැරියුත් තෙරණුවන් සමීපයෙහි පැවිදි වී පෙර භවයක අභිධර්මය අසා තිබූ පිනින් සැරියුත් තෙරුන්ගෙන් අසා දැනගත් අභිධර්මය හොඳින් වටහාගෙන සව්කෙලෙසුන් නසා රහත්භාවයට පත්වූහ. භාග්‍යවතුන් වහන්සේ වස්තුන් මස තුළ අභිධර්ම දේශනාව අවසන් කළහ.

සක්දෙව් රජ පාණ්ඩුකම්බල ශෛලාසනය ආදී සියලු ශක්‍ර සම්පත්ති බුදුන්ට පූජා කළේය. දස දහසක් සක්වල දෙව් බඹුන් ද අප්‍රමාණ පූජාවන් කළහ. මෙසේ අප භාග්‍යවතුන් වහන්සේ තුන්මසක් පුරාවටම දෙව්ලොවදී මාතෘ දිව්‍ය රාජයා ඇතුළු දෙව් පිරිසට අභිධර්මය දේශනා කොට නිමවා වදාළ සේක. එම අවස්ථාවේ මාතෘ දිව්‍ය පුත්‍ර රාජයා මුල් කෙලෙසුන් දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයෙහි පිහිටා සියලු දිව්‍ය සේනාවට පළමු හුනස්නෙන් නැඟී දොහොත් මුදුන් දී ''ස්වාමීනි සංසාරයෙහි අනේක භවවල මටම දරුවා වී මා කුසින් ඉපිද මට බොහෝ සම්පත් දෙවූ සේක. දැන් නිවන් සම්පත් දී කෘතෝපකාරයෙහි මුදුන් පැමිණි සේකයි. සාධු නාද දෙමින් නමස්කාර කළහ. නොයෙකුත් භවවලදී මට දරුව ඉපිද මට දුක් පීඩා ලැබුන අවස්ථා වලදී ඔබ වහන්සේ ඒ හැම විටකම මට පිහිට වූ සේක.

මේ භවයෙහි දී සුදොවුන් මහරජතුමාට අග මෙහෙසියව මහමායා නම් බිසොව රූපයෙන් අගතැන්පත්ව නුඹ මා කුස පිළිසඳගත් පිනින් දස දහසක් සක්වළ මහපොළෝ ගුගුරුවාලීමි. මෙරගල් සක්වල ගල් නටවාලිමි. නුඹ මා කුසින් බිහිවූ වේලෙහි නුඹ වැනි පුතකු බිහිකළ පිනින් මහබඹුන් අතින් පවා වැඳුම් ලැබීමි. මේ ලෝකයේ පුතුන් පතන්නාවූ මවුන් නුඹ වැනිම පුතුන් ලබත්වා. පෙර මා විසින් පෙවූ තනකිරට නුඹ විසින් මට පොවාපූ දහම් කිරි බොහොව. ස්වාමීනි මපුතුණුවන් වහන්ස බුදු කෙනෙකුට මවු වීමේ ආනිසංස ලදුයෙමි. නුඹ වැනි පින්වතෙකු බිහිකළ කුසින් වෙන ළාමකවූ සත්වයෙකු නොවදමි. මතු සත්වරකට වඩා මම සසරෙහි නොඇවිදිමි. ඒ සත් භාවයන් දෙව්ලොව හෝ බඹලොවයි. ස්ත්‍රී ආත්මයෙන් මිදී පුරුෂ ආත්මභවයෙකු දු ලැබීමි. නුඹ වැදූ පින් බලයෙන් මාගේ සියලඟින් නිකුත් දිව්‍ය ශෝභාවෙන් මේ දස දහසක් සක්වල දෙවියන් බඹුන් පරදවන අයුරු බලා වදාළ මැනවැයි යනාදී වශයෙන් බැතිබර වදන් වලින් බුදුන්ට ස්තුති කළස් මතෘ දිව්‍ය පුත්‍රයාණෝ අප්‍රමාණ වූ නමස්කාර පූජාකළහ. මෙසේ භාග්‍යවතුන් වහන්සේගේ අභිධර්ම දේශනාව අසා අසූ කෙළ දහසක් දෙවියෝ අමාමහනිවන් දුටුවාහ.

අප බුදුන් බුදුව වැඩහුන් මේ පන්සාලිස් හවුරුද්ද මුළුල්ලෙහි දස දහසක් සක්වල දෙවියන් රැස්ව තුන්මසක් මුළුල්ලෙහි මෙබදු වූ පූජාවන් මෙබඳු වූ සමාගමයක් අන් කිසිකලෙකත් නොවීය. මෙවැනි සමාගමෙන් හා පූජාවන් ලබන්නේ බුදුවරුන්ම පමණෙකි.

මෙසේ දෙව් බඹුන්ගේ අපමණ පුදපූජාවන් ලැබූ දේවාති දේව වූ බ්‍රහ්මාති බ්‍රහ්ම වූ පූජනෙය්‍යානි පූජනීය වූ මාගේ අමාමෑණී වූ බුදු පියාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා. නව ලොවුතුරා ශ්‍රී සද්ධර්මයටද මාගේ නමස්කාරය වේවා. සුපටිපන්නවූ සඟ පරපුරටද මාගේ නමස්කාරය වේවා.

## - පට්ඨාන ධම්මෝ චිරං තිට්ඨතු -

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මා සරණං ගච්ඡාමි
සංඝං සරණං ගච්ඡාමි

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි

දසබලධාරිං මහා කාරුණිකං අසාධාරණඤාණං අනන්තඤාණං අරිය ගුණවන්තං මහා ගුණවන්තං වන්දණෙය්‍යාහි වන්දනීයං පූජණෙය්‍යාහි පූජනීයං දක්ඛිණාරහං වන්දනාරහං ලෝකනාථං සබ්බඤ්ඤුං සබ්බ දස්සාවිං ධම්මරාජංධම්මස්සාමි අනන්ත පුඤ්ඤවන්තං සමන්ත චක්ඛුං

දිපදුත්තමං භගවන්තං සම්මා සම්බුද්ධං අනුස්සරාමි සම්මා සම්බුද්ධං සිරමා නමාමි.

නමෝ තේ පුරිසාජඤ්ඤ නමෝ තේ පුරිසුත්තම
නමෝ තේ පුරිසාතුලස නමෝ තේ පුරිසාසභ

ආජඤ්ඤ පුරුෂ වූ භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා. උත්තම ශ්‍රේෂ්ඨ පුරුෂ වූ භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා. අසමසම පුරුෂ වූ භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්ම රත්නයටද සුපටිපන්නවූ ආර්ය මහා සංඝරත්නයටද ගෞරවාදරයෙන් නමස්කාර කරමි. සුවාසූ දහසක් ධර්මස්කන්ධ අතරින් ධර්මස්කන්ධ 42000 ක් ම ඇතුළත් වන්නේ අභිධර්ම පිටකයෙහිය. අභිධම්ම යන්නෙහි තේරුම වන්නේ අතිවිශිෂ්ට වූ ගැඹුරු ධර්මය යනුයි. අභිධර්ම පිටකය අයත් ප්‍රකරණ හතකි.

ධම්මසංගණී ප්‍රකරණය, විභංග ප්‍රකරණය, කථාවත්ථු ප්‍රකරණය, පුග්ගල පඤ්ඤත්ති ප්‍රකරණය, ධාතුකථාප්පකරණය, යමක ප්‍රකරණය, පට්ඨාන ප්‍රකරණය යනුවෙනි. මෙම ප්‍රකරණ අතර ඉතාම සුවිශේෂී ප්‍රකරණය ලෙස පට්ඨාන ප්‍රකරණය පෙන්වා දිය හැකිය.

වෙසක් පුන් පොහොය දින ජය ශ්‍රී මහ බෝමැඩදී චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධ කරගෙන බුදුබව ලැබූ භාග්‍යවතුන් වහන්සේගේ බුදු සිරුරෙන් නීල පීත ලෝහිත, ඕදාත, මාජිෂ්ඨ හා ප්‍රභාස්වර යන සවනක් බුදුරැස් විහිදීම ආරම්භ වූයේ දෙවියන් විසින් තනන ලද රුවන්ගෙහි වැඩ වසමින් මේ අති විශිෂ්ට වූ පට්ඨාන ධර්මය සතරවන සතියේදී සිහිපත් කරන අවස්ථාවේදීය. ත්‍රිපිටක ධර්ම ග්‍රන්ථ අතර විශාල ග්‍රන්ථය වන්නේ මේ පට්ඨාන ප්‍රකරණයයි. මෙහි ධර්ම කරුණු අනන්ත නය සමන්නාගත යනුවෙන් හඳුන්වා ඇත. අනන්ත නය සමන්නාගත යනු කෙළවරක් නැති න්‍යායයන්ගෙන් සමන්විත වූ ධර්මය යන්නයි. බුදු දහමේ චිත්ත, චෛතසික, රූප, නිබ්බාන යයි පරමාර්ථ ධර්ම හතරකි. මින් චිත්ත, චෛතසික රූපයක් හටගැනීම සඳහා උපකාර වන්නාවූ හේතු එසේ නැතිනම් ප්‍රත්‍යය උපකාරක ධර්ම ඒ උපකාරක ධර්මයන්ගෙන් හට ගන්නා වූ ප්‍රත්‍යොත්පන්න වූ ඵලධර්ම එනම් හේතුඵල න්‍යාය ප්‍රත්‍ය විසි හතරක් (24) ඇසුරු කරගෙන භාග්‍යවතුන් වහන්සේ විග්‍රහ කර තිබෙනවා.

බුදු දහම හේතුඵල දහමකි. බුදුන් වහන්සේ මෙම හේතුඵල දහම ඉතා කෙටියෙන් චතුරාර්ය සත්‍ය දේශනාව තුළ විග්‍රහ කර ඇති අතර මධ්‍යම ප්‍රමාණයෙන් පටිච්ච සමුප්පාදය ඇසුරෙන් දක්වා ඇත. ඉතා සවිස්තර ලෙස මෙම හේතුඵල දහම විග්‍රහ කර ඇත්තේ අනන්ත නය සමන්නාගත පට්ඨාන ප්‍රකරණය තුළය.

ප්‍රාග් බෞද්ධ යුගයේ බමුණු මතය වූයේ මේ ලෝකය හා සත්වයාව මවන ලද්දේ මහා බ්‍රහ්මයා බවයි. එනිසා ඔහු සතුටු වන අන්දමේ යාගහෝම ආදිය කළයුතු බවයි. එම නිර්මාණවාදය අර්ථශූන්‍ය පිළිගත නොහැකි දෙයක් බවත් සත්වයා ඉබේ හටගැනීමක් නොවන බවත් හේතු රාශියකගෙන් හටගන්නාවූ ඵලයක් බවත් එකම හේතුවක් නොව හේතු රාශියක් යෙදෙන බවත් භාග්‍යවතුන් වහන්සේ හේතුඵල දහම මගින් ඉතා විචිත්‍රාකාරයෙන් විග්‍රහ කර දුන්හ. ඒ හේතු රාශිය පිළිබඳ විග්‍රහ කරන ඉතා උසස්ම දේශනාව වන්නේ සමන්ත පට්ඨාන දේශනාවයි.

**පට්ඨාන යන වචනයෙහි තේරුම වන්නේ**

නා නා ප්‍රකාර ප්‍රත්‍යයන් හා ඵලයන් දක්වා ඇති නිසාද
ප්‍රත්‍ය ධර්මයන් ඉතා විස්තර අයුරින් බෙදා වදාළ නිසාද
සියල්ල දන්නා සම්බුදු නුවණට ඉඩකඩ ඇතිව මෙනෙහි කිරීමට ලැබුණු නිසාද පට්ඨානය යැයි කියනු ලැබේ.

එසේම බුදුදහම හා දාර්ශනික මත තීරණය කිරීමට පට්ඨානය ඉතාම සුදුසු වෙයි. එම නිසා සියලු ධර්මයන් පිහිටා ඇති හෙයින් පට්ඨානය ඉතා සුවිශේෂී වෙයි.

භාග්‍යවතුන් වහන්සේ වදාළ නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය සූත්‍ර, විනය, අභිධර්ම යනුවෙන් සංඝායනා වලදී පිටක තුනකට බෙදා දැක්විණ. සූත්‍ර පිටකය සුවාසූ ධර්මස්කන්ධයෙන් 21000 ධර්මස්කන්ධද විනය පිටකයට 21000 ධර්මස්කන්ධද අභිධර්ම පිටකයට 42000 ක් ධර්ම ස්කන්ධ ද අයත් විය.

එසේම බුද්ධ ශාසනය පර්යාප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේධ වශයෙන් කොටස් තුනකට බෙදේ.

බුදුන් වහන්සේ විසින් වදාරණ ලද සුවාසූ දහසක් ධර්මස්කන්ධය ත්‍රිපිටක අටුවා ග්‍රන්ථ වල සුරැකිව ග්‍රන්ථාරූඨකර ඇත. පර්යාප්ති ශාසනය යනු එයයි.

ප්‍රතිපත්ති ශාසනය යනු සසර දුක නිම කිරීම සඳහා ශීල, සමාධි, ප්‍රඥා මාර්ගයෙහි හැසිරීමයි.

ප්‍රතිවේධ ශාසනය යනු මේ නිසා ලබාගන්නා සෝවාන් සකෘදගාමී, අනාගාමී, අරහත් යන ලෝකෝත්තර මාර්ගඵලයි.

බුද්ධෝත්පාද කාලය අවුරුදු පන්දාහකි. බුදුන් වහන්සේ පිරිනිවී අවුරුදු දහසක් යනතුරු මගඵල ලාභීහු විද්‍යාමාන වෙති. කල්ගත වන විට සෝවාන් පුද්ගලයෝද දක්නට නොලැබෙති. එය ප්‍රතිවේධ ශාසනයේ පිරිහීමයි.

කල්ගත වන විට ප්‍රතිපත්ති ශාසනයද පිරිහෙයි. සිල්වත් අන්තිම භික්ෂුව අපවත් වීමෙන් පසු ප්‍රතිපත්ති ශාසනයද ක්‍රම ක්‍රමයෙන් පිරිහීමට ලක්වෙයි.

බුද්ධෝත්පාද කාලය අවසන් වන කාලය වන විට පාර්යාප්ති ශාසනයද පිරිහීමට ලක්වෙයි. අට්ඨකථා පාළි ත්‍රිපිටකයට අයත් බුද්ධ වචනය පර්යාප්ති ශාසනයයි. විනය, සූත්‍ර, අභිධර්ම යන තුන්පිටකයෙන් පළමුව අභිධර්ම පිටකය පිරිහෙයි. ඉන් පළමුවම පට්ඨාන ප්‍රකරණය පිරිහෙයි.

අනතුරුවට සූත්‍ර පිටකයේ අංගුත්තර නිකායද අවසානයේ සූත්‍ර පිටකයේ දීඝ නිකායද පිරිහෙයි. අනතුරුව ඛුද්ධක නිකායේ කොටස් 15 අතරින් අන්තිමට ජාතක කථාද පිරිහෙයි. අන්තිමටම විනය පිටකය පිරිහීමට ලක්වෙයි.

අවුරුදු පන්දහසක් අවසන ධාතු පරිනිර්වාණය සිදුවෙයි. බුදුන් වහන්සේ හා සම්බන්ධ පරිනිර්වාණ තුනකි. ඒ ක්ලේශ පරිනිර්වාණය, ස්කන්ධ පරිනිර්වාණය හා ධාතු පරිනිර්වාණයයි. බුදුන් වහන්සේගේ ක්ලේශ පරිනිර්වාණය බුදුවූ අවස්ථාවේ බුද්ධගයාවේ ජය ශ්‍රී බෝධි මූලයේදී සිදුවිය. ස්කන්ධ පරිනිර්‍රාවණය කුසිනාරා නුවර මල්ල රජ දරුවන්ගේ උපවත්තන සල් උයනෙහිදී සිදුවිය. ධාතු පරිනිර්වාණය ගෞතම බුදු සසුනට වසර පන්දහසක් සම්පූර්ණ වූ කල්හි වෙසක් පුර පසළොස්වක පොහෝ දිනයෙහි දී සිදුවෙයි.

එම පොහෝ දින ලංකාවේ මහියංගන, මැදිරිගිරිය, කැළණිය, දීඝවාපිය, සේරුවිල, ගිරිහඬුසෑය, ජේතවනය ආදී ලක්දිව ස්ථූපයන්හි වැඩ සිටින සියලුම සර්වඥධාතූන් වහන්සේලා අහසට පැන නැගී අනුරාධපුර රුවන්වැලි මහ සෑයේ ද්‍රෝණයක් ධාතූන් වහන්සේලා වැඩ සිටින ස්ථානයට එක් රැස්වෙති. එදින ධාතු නිදන් කළ දිනයේ සිට ඒ දක්වා ධාතු ගර්භයේ දැල්වෙමින් තිබූ සිංහ තෙල් පහන් නිවීයයි. අනතුරුව රුවන්වැලි මහසෑයේ ධාතු ගර්භයට රැස්වෙන ඒ සියලුම සර්වඥ ධාතූන් වහන්සේලා අහසට පැන නැගී එකට අමුණන ලද මුතු ඇට පෙළක් මෙන් නාගදීපයේ රාජායතන චෛත්‍යය වෙත වැඩම කර බුදුන් වහන්සේ දෙවෙනි වර ලක්දිවට වැඩම කළ අවස්ථාවේ වැඩ සිටි මැණික් පුටුව මත තැන්පත් වෙති. මෙහිදී අප්‍රමාණ නාගයින්ගේ පුද පූජාවන්ට ලක්වන ධාතූන් වහන්සේලා මැණික් පුටුව සමගම අහසට පැන නැගී දඹදිව බුද්ධගයාවේ ජය ශ්‍රී මහ බෝධි මූලයට වැඩම කරති.

අනතුරුව ලෝකයේ සියලුම තන්හි බ්‍රහ්මලෝකවල දිව්‍ය ලෝකවල, නාගලෝක වල පවා වැඩ සිටින සර්වඥ ධාතූන් වහන්සේලා ද ඒ ඒ ස්ථාන වලින් අහසට පැන නැගී ශ්‍රී මහා බෝධි මූලයට වැඩම කරති. ඒ සමගම මහා වජ්‍රාසනයක් පොළොව පලාගෙන ඉහළට මතුවෙයි. එම වජ්‍රාසනය මත සියලු ධාතූන් වහන්සේලා තැන්පත් වෙති. පසුව ඒ සියලුම ධාතූන් වහන්සේලා එකතු වී බුදුරුව මවාගනිති. ඒ ඒ ධාතූන් වහන්සේලා බුදු සිරුරෙහි පෙර තිබූ පරිදිම තැන්පත් වෙති. ද්‍රෝණ අටක නැතිනම් නැළි දහසයක තරම් වූ විවිධ ප්‍රමාණ වූ අසපීධාතු පෙර තිබූ ස්ථානවලම පිහිටයි. අනතුරුව දෙතිස් මහා පුරුෂ ලක්ෂණ හා අසූව අනු ව්‍යංජන ලක්ෂණ ද පහළ වෙයි. බුදු සිරුරෙන් සවනක් බුදුරැස් විහිදෙයි. එම රශ්මිය දහදහසක් ලෝකවල පැතිර යයි.

මේවා දකින දිව්‍ය බ්‍රහ්මයෝ ''අද අපගේ බුදුන්ගේ ධාතු පරිනිර්වාණය සිදුවෙනවා'' යයි කියා වහ වහා දිවමල් සුවඳ දුම් ගෙන ජය ශ්‍රී බෝධි මූලයට රැස්වෙති.

එක්ලහි බුදුරුව අහසට පැන නැගී යමා මහ පෙළහර දක්වති.

එකල්හි බුදුරුව යමාමහ පෙළහර දක්වා අහසින් බැස වජ්‍රාසනය මත වැඩ සිටිති. ඒ සමගම බුදු සිරුරෙන් මහත්වූ ගිනි ජාලාවක් හටගෙන ආදාහනය වෙයි. මෙය දකින දෙව් බඹහු අහසේ අදින් පසු ලෝකය හිස්ව යන්නේය. බුද්ධාලෝකය නිවී ගියේය. කිය කියා වැළපෙති. සියලුම ධාතු දැවී අලුවී යයි. මෙම සිදුවීම ධාතු පරිනිර්වාණය නමින් හැඳින්වෙයි.

මින් පසුව අවුරුදු වශයෙන් ගතහොත් අවුරුදු කෝටි ගණනකට පමණ පසුව මෛත්‍රී බෝසතුන්ගේ උපත සිදුවෙයි.

මේ නිසා සසරෙහි බියකරු බව දැනගෙන සැදැහැත්තෝ මේ බුද්ධෝත්පාද කාලයෙහිම හෝ මෛත්‍රී බුදුන් දැක සසර දුක් කෙළවර කිරීමට උත්සාහ ගනිත්වා.

නමෝතස්ස භගවගෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

## පට්ඨාන බුද්ධ වන්දනා නමස්කාරය

විචිත්ත මති ගම්භීර - මනන්ත නය මණ්ඩිතං
පට්ඨානං සම්මසන්තස්ස - විමලාමිත බුද්ධියා

යස්ස දේහා නික්ඛමිංසු - සුභා ඡබ්බණ්ණරංසියෝ
නීලපීතා රත්ත සේතා - මඤ්ජිට්ඨාච පභස්සරා

තං ලෝකනාථං සුගතං - ධම්මඤ්ච ජින සේවිතං
සංඝං නිරංගණං සෙට්ඨං - නමාමි සිරසාදරං

තේරුම :- විසිතුරු වූ ඉතා ගැඹුරු වූ අනන්ත වූ න්‍යායයන්ගෙන් සැරසුණු පට්ඨාන ධර්මය පිරිසිඳු අපරිමිත බුදු නුවණින් මෙනෙහි කරන්නා වූ

යම් බුදු කෙනෙකුගේ ශ්‍රී ශරීරයෙන් කාන්තිමත් පැහැබර නිල් කහ රතු සුදු මදට පැහැ යන සවණක් රශ්මි මාලාවන් නික්මුණාහුද?

තුන්ලොවට පිහිටවූ ශ්‍රී සුගත සම්මා සම්බුදු රජාණන් වහන්සේටද ජිනේන්ද්‍ර වූ ධර්මස්වාමි වූ තථාගතයන් වහන්සේ විසින් සේවනය කරන ලද නෛර්යානික ශ්‍රී සද්ධර්ම රත්නයටද ශ්‍රේෂ්ඨවූ, කෙළෙසුන්ගෙන් පිරිසිඳු වූ ආර්ය මහා සංඝ රත්නය ගෞරවාදරයෙන් සිරස නමා වඳිමි.

හේතුඵල දහම පිළිබඳව විග්‍රහ කරන ඉතා උසස්ම දේශනාව තමයි පට්ඨාන දේශනාව එහි ප්‍රත්‍ය ලෙස විග්‍රහ කර මාතෘකා විසි හතරක් (24) සඳහන් වෙයි.

1. හේතු පච්චයෝ
2. ආරම්මණ පච්චයෝ
3. අධිපති පච්චයෝ
4. අනන්තර පච්චයෝ
5. සමනන්තර පච්චයෝ
6. සහජාත පච්චයෝ
7. අඤ්ඤමඤ්ඤ පච්චයෝ
8. නිස්සය පච්චයෝ
9. උපනිස්සය පච්චයෝ
10. පුරේජාත පච්චයෝ
11. පච්ඡාජාත පච්චයෝ
12. ආසේවන පච්චයෝ
13. කම්ම පච්චයෝ
14. විපාක පච්චයෝ
15. ආහාර පච්චයෝ
16. ඉන්ද්‍රිය පච්චයෝ
17. ඣාන පච්චයෝ
18. මග්ග පච්චයෝ
19. සම්පයුත්ත පච්චයෝ
20. විප්පයුත්ත පච්චයෝ
21. අත්ථි පච්චයෝ
22. නත්ථි පච්චයෝ
23. විගත පච්චයෝ
24. අවිගත පච්චයෝ

මේ ප්‍රත්‍යය විසිහතර පිළිබඳ අවබෝධ කරගත හැකිනම් මේ ප්‍රත්‍ය විසිහතර එකකට එකක් ප්‍රත්‍යය වෙමින් චිත්ත චෛතසික රූප ධර්මයන්ගේ හට ගැනීමට උපකාර වන ආකාරය විමසා බලන්න පුළුවන් මේවා අතරින් ප්‍රත්‍යයෙන් හටගන්නා ධර්ම ඇතිවීමට උපකාර වන්නේ එක් ප්‍රත්‍යයක් පමණක් නොවේ. ඒ සඳහා ප්‍රත්‍ය බොහෝ ගණනකගේ උපකාර ලැබිය යුතුය. එකම ධර්මයක් එක් ධර්මයකට එක් ආකාරයෙන් ද වෙනත් ධර්ම වලට වෙනත් ආකාරයකින් ද උපකාර වෙයි. මෙහිදී යම්කිසි ආකාරයකට අන්‍ය ධර්මයකට උපකාරී වන ධර්මයට ප්‍රත්‍ය ධර්ම යයි කියනු ලැබේ. ඒ ප්‍රත්‍ය ධර්මයන් නිසා ඇතිවන ඵලවලට ප්‍රත්‍යයෝත්පන්න ධර්ම කියා කියනු ලැබේ. යම්කිසි ප්‍රත්‍ය ධර්මයන් අතර ප්‍රත්‍යයෝත්පන්න බවට පත් වන්නේ නැති ධර්මයක් ඇත්නම් ඒවාට ප්‍රත්‍යනික ධර්මය යයි කියනු ලැබේ. මේ ධර්ම තුන ත්‍රී රාශිය ලෙස හඳුන්වනු ලැබේ. තව දුරටත් පැහැදිලි කලොත් ප්‍රත්‍ය යනු නූපන් චිත්ත චෛතසික රූප ධර්මයන් ඉපදීමටත් පැවතීමටත් උපකාර වන ධර්ම ප්‍රත්‍යධර්ම වෙයි. ප්‍රත්‍යෝත්පන්න ධර්ම වන්නේ ප්‍රත්‍ය ධර්මයන් නිසා හටගන්නා වූ චිත්ත, චෛතසික හා රූප ධර්මයි. ප්‍රත්‍යනීක වන්නේ පත්‍යෝත්පන්න භාවයට නොපැමිනෙන ප්‍රත්‍යය ධර්මයි.

මෙම පට්ඨාන ධර්මය නිතර මෙනෙහි කරන මහාගතිගම්ය නිස්සදත්ත තෙරුන්වහන්සේ ජය ශ්‍රී මහ බෝධිය නැමදීම පිණිස දඹදිව යද්දී නැවේ සිට මුහුදු රළ අතරක් නොමැතිව නැගෙන අයුරු බලා පට්ඨානයේ සූවිසි ප්‍රත්‍යය වූ නොවුනට ප්‍රතිය වන ආකාරය මීටත් වඩා සුවිශේෂි බව මෙනෙහි කරමින් සව් කෙලෙසුන් නසා රහත් භාවයට පත්වූහ.

## හේතු පච්චයෝති - හේතු ප්‍රත්‍යය යනු

යම්කිසි ධර්මයක් ඇති වීමට සහ පැවතීමට මූල භාවයෙන් උපකාර වන ධර්මය හේතු ප්‍රත්‍යය නම් වෙයි. මූල භාවයෙන් අනෙක් ධර්මවලට උපකාර වන ධර්ම හයක් තිබේ. ඒවා නම් ලෝභ, දෝස, මෝහ සහ අලෝභ, අදෝස, අමෝහ යන අකුසල හා කුසල හේතු හයයි. පොළොවට තදින් අල්ලා ගන්නා ගස්වල මුල්මෙන් මේ හේතු ධර්ම සය අරමුණු තදින්ම අල්ලා ගනී. මෙම චෛතසික ධර්ම හයෙහි උපකාරයෙන් චිත්ත, චෛතසික හා රූප ධර්මයන් හටගනී. මේ අනුව හේතු ප්‍රත්‍ය පරමාර්ථ ධර්ම තුනක හට ගැනීමට උපකාර වෙනවා. එහිදී හට ගත් චිත්ත, චෛතසික ධර්ම, නාම ධර්ම වලට අයත් වන අතර රූප ධර්ම රූප පරමාර්ථයට අයත් වෙනවා.

සම්මුති වශයෙන් මම යනුවෙන් හඳුන්වන පුද්ගලයා තුළ ඇත්තේ නාම රූප යන ධර්මතා දෙකකි.



Free distribut

හේතු හේතු සම්පයුක්තකානං ධම්මානං
තං සමුට්ඨානානඤ්ච රූපානං
හේතු පච්චසේන පච්චයෝ

මෙම හේතු ධර්මයක් (චෛතසික) ලෝභ, දෝස, මෝහ, අලෝභ, අදෝස, අමෝහ සිතෙහි හටගන්නා විට එකටම යෙදෙන අනෙක් සම්ප්‍රයුක්ත ධර්මද හේතු අනුව අරමුණ ස්ථිරවම ගනිමින් ඔවුන් හා බැඳී උපදිති. තේ කෝප්පයක ජලය, සීනි, කහට, කිරි එකට මිශ්‍රවී ඇතුවා සේ මේ හේතු සමග චිත්ත, චෛතසික, රූප ධර්මයන් එකවිටම උපදියි.

හේතු ප්‍රත්‍යයේ යෙදෙන විසර්ජනාචාර හතකි. (වීථිපාළි) 7 කි.

කුසලෝ ධම්මෝ කුසලස්ස ධම්මස්ස හේතු පච්චයේන පච්චයෝ
කුසලා හේතු සම්පයුත්තකානං ඛන්ධානං හේතු පච්චයේන පච්චයෝ

කුසල ධර්මය කුසල ධර්මයට හේතු ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වෙයි. මෙහි කුසල හේතු වන්නේ අලෝභ, අදෝෂ, අමෝහ යන චෛතසික තුනයි. මේ කුසල චෛතසික හට ගන්නේ කුසල අරමුණකයි. මෙහි සම්ප්‍රයුක්ත ධර්ම යනු මිශ්‍රව කුසල්, රූපාවචර කුසල්, අරූපාවචර කුසල් සහ ලෝකෝත්ර කුසල් යනුවෙන් කුසල් වර්ග හතරක් තිබෙනවා. කුසලයක් කරන විට අප හට ඇතිවන්නේ කාමාවචර කුසල් ඒ කාමාවචර කුසල් සිත් අටක් තිබෙනවා.

1. සෝමනස්ස සහගත ඥාණ සම්ප්‍රයුක්ත අසංඛාරික සිත
2. සෝමනස්ස සහගත ඥාණ සම්ප්‍රයුක්ත සසංඛාරික සිත
3. සෝමනස්ස සහගත ඥාණ විප්‍රයුක්ත අසංඛාරික සිත
4. සෝමනස්ස සහගත ඥාණ විප්‍රයුක්ත සසංඛාරික සිත
5. උපේක්ෂා සහගත ඥාණ සම්ප්‍රයුක්ත අසංඛාරික සිත
6. උපේක්ෂා සහගත ඥාණ සම්ප්‍රයුක්ත සසංඛාරික සිත
7. උපේක්ෂා සහගත ඥාණ විප්‍රයුක්ත අසංඛාරික සිත
8. උපේක්ෂා සහගත ඥාණ විප්‍රයුක්ත සසංඛාරික සිත

කුසල ක්‍රියාවක් කරන විට මේ කුශල සිත් අටෙන් එකක් ඇතිවෙනවා. මෙම සිත් වල නැතිනම් කාමාවචනර කුසල් ත්‍රිහේතුක කුසල් සහ ද්විහේතුක කුශල් වශයෙන් කොටස් දෙකකට බෙදෙනවා. මෙම ත්‍රිහේතුක සහ ද්විහේතුක කුසල් නැවත උත්කෘෂ්ට ඕමක වශයෙන්ද බෙදෙනවා. එනම් ත්‍රිහේතුක උත්කෘෂ්ට කුසල් ත්‍රිහේතුක ඕමක කුසල් ද්විහේතුක උත්කෘෂ්ට කුසල් ද්විහේතුක ඕමක කුසල්

ආදී ලෙස බෙදෙනවා. යම් කුසලයක් කරන අවස්ථාවේ අලෝභ අදෝස අමෝහ චෛතසික ඉතා බලවත් සිතෙහි හටගෙන ඇත්නම් ඒවා ත්‍රිහේතුක උත්කෘෂ්ට කුසලයක් වෙනවා. අවස්ථාවේ අලෝභ, අදොෂ, අමෝහ යන සිතුවිලි දුර්වල වශයෙන් අඩු වශයෙන් යෙදෙන විට එම කුසලය ත්‍රිහේතුක ඕමක කුසලයක් වෙනවා. ඥාණ සම්ප්‍රයුක්ත සිත් ත්‍රිහේතුකයි. ඥාණ විප්‍රයුක්ත සිත් වල ඇත්තේ හේතු දෙකකි. අලෝභය, අදෝසය පමණි. අමෝහය හෙවත් ප්‍රඥාව නොමැත. කර්මඵල විස්වාසයක් නොමැතිව කරන විට අමෝහය නැහැ. එය ද්විහේතුක කුසලයක් වෙනවා. යම් කුසලයක් කරන විට අලෝභ අදෝස චෛතසික දෙක බලවත්ව යෙදී ඇත්නම් ද්විහේතුක උත්කෘෂ්ට කුසලයක් වෙනවා. දුර්වලව යෙදී ඇත්නම් ද්විහේතුක ඕමක කුසලයක් වෙනවා. පස්දෙනකු එකතු වී යම් කුසල ක්‍රියාවක් කලානම් එම කුසලයේ විපාකය එක හා සමාන වන්නේ නැහැ. හේතුව ඒ කුසලය ඥාණ සම්ප්‍රයුක්තව කරනවා විය හැකියි. තව කෙනකු ඒ කුසලය ඥාණ විප්‍රයුක්තව කරනවා විය හැකියි. කෙනෙකුට ත්‍රිහේතුක උත්කෘෂ්ට කුසලයක් වෙන්න පුළුවන්. කෙනෙකුට ත්‍රිහේතුක ඕමක වෙන්න පුළුවන්.

මෙසේ කුසල් සිත් හටගන්නේ අලෝභ, අදෝස, අමෝහ යන කුසල මූලික චෛතසික ධර්ම තුන හේතු කරගෙනයි.

සෝමනස්සහගත මේ ඥාණ සම්ප්‍රයුක්ත කුසල් සිත අසංකාරික නම් ඒ පුද්ගලයා එම කුසලය කරන්නේ කාගේවත් කීමට නොවෙයි. තමාටම හිතුන කුසල් සිතුවිල්ලක් නිසයි. සසංකාරික වුවහොත් ඒ තැනැත්තා එම කුසලය කර ඇත්තේ වෙන කෙනකු කියූ නිසා හෝ අනෙකුගේ මෙහෙය වීමක් ඇතිවයි.

එසේමෙ මේ අලෝභ, අදෝස අමෝහ චෛතසික මුල් කරගෙන කරන කුසල ක්‍රියාව නිසා සෝමනස්ස සහගත ඥාණසම්ප්‍රයුක්ත අසංකාරික හෝ සසංකාරික සිත් සමග චෛතසික ධර්ම තිස් අටක් උපදිනවා.

දන්දීම, සිල්රැකීම, භාවනා කිරීම, තෙරුවන් වන්දනාව, ධර්මශ්‍රවණය, පින්දීම, පින් අනුමෝදන් වීම ආදී යහපත් ක්‍රියාවන්ට කුසල කර්ම යයි කියනු ලැබේ. මේ අවස්ථා වලදී කාමාවචර කුසල් සිත් අට රූපාවචර කුසල් පහ අරූපාවචර කුසල් සිත් හතර, ලෝකෝත්තර කුසල් සිත් 4 යන කුසල් සිත් විසි එකක් සමග සම්ප්‍රයුක්ත චෛතසික ධර්ම තිස් අටකුත් (38) උපදියි. එම චෛතසික වනුයේ සබ්බ චිත්ත සාධාරණ (7) ප්‍රකීර්ණක (6) සෝභන සාධාරණ 19 විරති 3 අප්‍රමාණය 2 සහ ප්‍රඥ චෛතසිකය | $7+6+19+3+2+1=38$

අලෝභ අදෝස අමෝහ කුසල චෛතසික සමගම කුසල සිත්ද ඒ කුසල් සිත් වල හටගන්නා චෛතසිකයත් රූප ධර්මත් එකම මොහොතේ එකම චිත්ත ක්ෂණයක හටගනු ලබනවා.

තං සමුට්ඨානානඤ්ච රූපානං යනුවෙන් මුල් ගාථාවේ දැක්වූ කරුණ විමසා බලමු. සමුට්ඨාන රූප වර්ග හතරකි. චිත්තජ රූප, කර්මජ රූප, සෘතුජ රූප සහ ආහාරජ රූප යනුවෙන් 4 කි.

මෙහිදී හේතු ප්‍රත්‍යයෙන් හටගන්නා රූප වන්නේ චිත්තජ රූප හා ප්‍රතිසන්ධි කර්මජ රූප යන දෙකයි. සිතෙහි උප්පාදක්ෂණයෙහි චිත්තජ රූප හටගනී. ඨිති හා භංග ක්ෂණවලදී චිත්තජ රූප හට නොගනී. එසේම සෑම සිතකම චිත්තජ රූප හට ගන්නේ නැත.

එනම් අකුසල විපාක සිත්වල චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ යන අහේතුක විපාක සිත් පහෙත් එම නම් වලින්ම කියවෙන කුසල විපාක පහෙත් එනම් එම විඤ්ඤාණ සිත් දහයෙහි චිත්තජ රූප පහළ වෙන්නේ නැත. සියලුම අහේතුක සිත් 18 හි චිත්තජ රූප හටගන්නේ නැත. චිත්තජ රූප පසළොසකි. (15 කි)

ඒකාන්ත චිත්තජ රූප දෙක (2)
කාය විඤ්ඤාත්ති, වචී විඤ්ඤත්ති

අනේකාන්ත චිත්තජ රූප දහතුනකි. (13)
ආකාස ධාතුව 1
ශබ්ද රූපය 1
විකාර රූප 3 (ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා)
අවිනිබ්භෝගරූප 8

ඒකාන්ත චිත්තජ රූප 2 + අනේකාන්ත චිත්තජ රූප 13 = 15

අවිනිබ්භෝගරූප = පඨවි, ආපෝ, තේජෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා

මේ චිත්තජ රූප 15 සිතෙහි උප්පාදක්ෂණයේ හටගන්නා අතරම සිතත් චෛතසිකත් ඒ සමගම හටගන්නවා. මේ සියල්ලම ගත් විට නාම ධර්ම සහ රූප ධර්මයි.

මේවා ස්කන්ධ පහට වෙන්කර දැක්විය හැකිය.

| | | |
|---|---|---|
| චිත්තජ රූප සහ කර්මජ රූප | = | රූපස්කන්ධය |
| කුසල් සිත් | = | විඤ්ඤාණ ස්කන්ධය |
| චෛතසික වල වේදනාව | = | වේදනා ස්කන්ධය |
| චෛතසික වල සංඥාව | = | සංඥා ස්කන්ධය |
| ඉතිරි චෛතසික තිස් හය | = | සංස්කාර ස්කන්ධය |

මෙසේ හටගත් ස්කන්ධ පහ සඳහා ප්‍රත්‍ය වූයේ අලෝභ අදෝස, අමෝහ යන කුසල මූල තුනයි. මේ කුසල ධර්මය තුළ පහළ වූ නාමරූප ධර්ම වලින් නාම ධර්ම සිත් සහ චෛතසික තවලෙසකට කිවහොත් රූපස්කන්ධය හැර ඉතිරි ස්කන්ධ හතර කුසල සිත බිඳී යාමත් සමග චිත්තක්ෂණයක් තුළ බිඳී යනවා. කුසල සිත් හටගන්නා විටම චෛතසික හටගන්නා අතර සිත් බිඳෙන විටම චෛතසික ධර්මත් බිඳී යනවා. ඒ කුසල සිත් වලින් හටගන්නා චිත්තජ රූප චිත්තක්ෂණ දාහතකින් (17) බිඳීයනවා. මේ අනුව කුසල අරමුණු තුළ හටගෙන ඇත්තේ පරමාර්ථ වශයෙන් චිත්ත චෛතසික රූප ධර්ම සමූහයක් මිස සත්වයෙකු පුද්ගලයෙකු නොවෙයි.

හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති

හේතුන්ගෙන් හටගෙන හේතු නැතිවෙන කල බිඳී යනවා. හේතු ප්‍රත්‍ය තුළින් මෙය අවබෝධ කර ගෙන තණ්හා දිට්ඨි මාන උපාදාන දුරු කර ගැනීමට හේතුඵල දහමක් මිස මෙහි සත්වයෙකු පුද්ගලයෙකු නොමැති බව නාමරූප ධර්මතා පමණක් බව මෙනෙහි කරමින් විදර්ශනා භාවනාවෙහි නිරතවන්නට අප සැම උත්සාහගත යුතුය.

## හේතු ප්‍රත්‍යයේ යෙදෙන අනෙකුත් විසර්ජනාවාර හය

2 වන වීථිය - කුසලෝ ධම්මෝ අබ්‍යාකතස්ස ධම්මස්ස හේතු පච්චයේන පච්චයෝ

3 වන වීථිය - කුසලෝ ධම්මෝ කුසලස්සච අබ්‍යාකතස්සච ධම්මස්ස හේතුපච්චයෙන පච්චයෝ

4 වන වීථිය - අකුසලෝ ධම්මෝ අකුසලස්ස ධම්මස්ස හේතු පච්චයේන පච්චයෝ

5 වන වීථිය - අකුසලෝ ධම්මෝ අකුසලස්ස ආබ්‍යාකතස්ස ධම්මස්ස හේතු පච්චයේන පච්චයෝ

6 වන වීථිය - අකුසලෝ ධම්මෝ අකුසලස්සච ආඛ්‍යාකතස්ස ධම්මස්ස හේතු පච්චයේන පච්චයෝ
7 වන වීථිය - අඛ්‍යාකතෝ ධම්මෝ ආඛ්‍යාකතස්ස ධම්මස්ස හේතු පච්චයේන පච්චයෝ

## හේතු ප්‍රත්‍යයේ ත්‍රි රාශිය

<u>ප්‍රත්‍යධර්ම</u>
ලෝභ, ද්වේෂ්, මෝහ, අලෝභ, අදෝෂ, අමෝහ
අලෝභ, අදෝෂ, අමෝහ ක්‍රියා හේතු තුන
අලෝභ, අදෝෂ, අමෝහ විපාක හේතු තුන

<u>ප්‍රත්‍යෝත්පන්න ධර්ම</u>
සහේතුක සිත් 71 හැත්තෑඑක
මෝහ මූල සිත් දෙකෙහි මෝහය හැර චෛතසික 52
සහේතුක චිත්තජ රූප, සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූප

<u>ප්‍රත්‍යනීක ධර්ම</u>
අහේතුක සිත් දහ අට 18
ඡන්දය හැර අන්‍ය සමාන චෛතසික දොළහ 12
මෝහ මූල සිත් දෙකෙහි මෝහය
අහේතුක චිත්තජ රූප
අහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූප
ආහාරජ රූප, ඍතුජ රූප

## 4 වන විසර්ජනාවාරය විමසමු.

අකුසලෝ ධම්මෝ අකුසලස්ස ධම්මස්ස හේතු පච්චයේන පච්චයෝ
අකුසලා හේතු සම්පයුක්තකානං ඛන්ධානං හේතු පච්චයේන පච්චයෝ

අකුසල හේතු තුනකි. ලෝභ, ද්වේෂ, මෝහ මෙම අකුසල් හේතු නිසා හටගන්නා සම්ප්‍රයුක්ත ධර්ම වන්නේ අකුසල් සිත් සහ අකුසල සිත් සමග සම්ප්‍රයුක්ත වන චෛතසික ධර්මයි. මෙහිදී අකුසල් සිත් සමග සම්ප්‍රයුක්ත වන චෛතසික ධර්ම සියල්ල අකුසල චෛතසික වශයෙන් සලකනවා. මෙහිදී ලෝභ, ද්වේෂ, මෝහ යන චෛතසික තුන දොළොස් ආකාර වූ අකුසල් සිත් හටගැනීමටත් ඒ අකුසල සිත් සමග මිශ්‍රව හට ගන්නා අකුසල චෛතසික 27 හට ගැනීමටත් උපකාර වෙනවා.

අකුසල් සිත් දොළසෙන් අටක් ලෝභ මූල සිත් වන අතර ද්වේෂ මූල සිත් දෙකකි. මෝහ මූල සිත් දෙකකි.

## ලෝභ මූල සිත් අට

1. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික සිත
2. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත සසංඛාරික සිත
3. සෝමනස්ස සහගත දිට්ඨිගත විප්‍රයුක්ත අසංඛාරික සිත
4. සෝමනස්ස සහගත දිට්ඨිගත විප්‍රයුක්ත සසංඛාරික සිත
5. උපේක්ෂා සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික සිත
6. උපේක්ෂා සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත සසංඛාරික සිත
7. උපේක්ෂා සහගත දිට්ඨිගත විප්‍රයුක්ත අසංඛාරික සිත
8. උපේක්ෂා සහගත දිට්ඨිගත විප්‍රයුක්ත සසංඛාරික සිත

## දෝස මූල සිත් දෙක

1. දෝමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත අසංඛාරික සිත
2. දෝමනස්ස සහගත පටිඝ සම්ප්‍රයුක්ත සසංඛාරික සිත

## මෝහ මූල සිත් දෙක

1. උපේක්ෂා සහගත විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිත
2. උපේක්ෂා සහගත උද්දච්ච සම්ප්‍රයුක්ත සිත

මෙහි ලෝභ මූල සිත් අට හට ගැනීමට ලෝභයත් මෝහයත් යන චෛතසික දෙක ප්‍රත්‍ය වෙනවා. ද්වේෂ මූල සිත් හට ගැනීමට ද්වේෂයත් මෝහයත් ප්‍රත්‍ය වෙනවා. මෝහ මූල සිත් දෙක හට ගැනීමට මෝහය ප්‍රත්‍ය වෙනවා.

අකුසල් සිත් හටගැනීමේදී කිසි විටෙකත් ලෝභ, ද්වේෂ, මෝහ හේතු තුනම කිසි විටෙකත් ප්‍රත්‍ය වෙන්නේ නැහැ. නමුත් කුසලය විස්තර කිරීමේදී අලෝභ අදෝස අමෝහ යන හේතු තුනම ත්‍රිහේතුකව උපකාරී වන අයුරු පෙන්වා දුන්නා. අකුසලයේදී ත්‍රිහේතුකව එක විට ප්‍රත්‍ය වෙමින් සිත් හටගන්නේ නැහැ. මේ සිත් දොළොසේම මෝහය තිබෙනවා. ලෝභ මූල සිත්වල ලෝභයත්, මෝහයත් ද්වේෂ මූල සිත්වල ද්වේෂය හා මෝහයත් මිස ලෝභය හා ද්වේෂය එකවර කිසි විටෙක යෙදෙන්නේ නැහැ.

මේ අනුව,

මෝහය මෝහ මූල සිත් සඳහාත්
මෝහය හා ලෝභය ලෝභ මූල සිත් සඳහාත්
මෝහය හා ද්වේෂය ද්වේෂ මූල සිත් සඳහාත් ප්‍රත්‍ය වෙනවා.

මෙම අකුසල් සිත් දොළොස සමග සම්ප්‍රයුක්ත වන චෛතසික ධර්ම විසි හතකි. (27 කි)

සබ්බ චිත්ත සාධාරණ 7
ඵස්ස වේදනා, සංඥා, චේතනා, ඒකග්ගතා, ජීවිතීන්ද්‍රිය මනසිකාර

ප්‍රකීර්ණක චෛතසික හය 6
විතක්ක, විචාර, අධිමොක්ඛ, වීරිය, ප්‍රීතිය, ඡන්දය

අකුසල චෛතසික දාහතර 14
ලෝභ දිට්ඨි මාන
දෝස, ඉජ්චා, මච්ඡරිය, කුක්කුච්චය
මෝහ, අහිරිකය, අනොත්තප්තය, උද්දච්චය
ථීන, මිද්ධ, විචිකිච්ඡාව

මෙම චෛතසික ධර්ම විසි හතෙන් 27 න් ලෝභ, ද්වේෂ, මෝහ චෛතසික ධර්ම තුන ප්‍රත්‍ය ධර්ම වන නිසා ඉතිරි චෛතසික 24 විසි හතර ප්‍රත්‍යොත්පන්න ධර්ම වෙනවා.

අකුසල හේතු නිසා හටගන්නා සමුට්ඨාන රූප වන්නේ චිත්තජ රූපයි. මෙසේ අකුසල හේතු නිසා හටගත් අකුසල සිත්, චෛතසික හා චිත්තජ රූප ස්කන්ධ වශයෙන් රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ යන ස්කන්ධ පහට බෙදා දක්වන්න පුළුවන්.

| | | |
|---|---|---|
| චිත්තජ රූප | = | රූපස්කන්ධයයි |
| වේදනා චෛතසිකය | = | වේදනා ස්කන්ධයයි |
| සංඥා චෛතසිකය | = | සංඥා ස්කන්ධයයි |
| ඉතිරි චෛතසික | = | සංස්කාර ස්කන්ධයයි |
| අකුසල් සිත් | = | විඤ්ඤාණ ස්කන්ධයයි |

ඒ අනුව මෙහි හටගෙන ඇත්තේ පඤ්චස්ඛන්ධයයි.

මේ අනුව හේතු ප්‍රත්‍ය සලකා බැලීමේදී හේතු ධර්ම මොනවාද? හේතු ධර්ම තුළින් හටගන්නේ මොනවාද? ඒ හටගන්නා දේ නිරෝධයට පත් කරන්නේ කෙසේද කියා හේතු ප්‍රත්‍යය ඉගෙනීමේදී වටහා ගත යුතුයි. ඒ නිසා අප සීල, සමාධි, ප්‍රඥා වඩමින් නිරෝධය කරා ළඟා වීමට උත්සාහ ගත යුතුය. මේ සඳහා නිරතුරු සතර සතිපට්ඨානයේ කායානුපස්සනා භාවනා, වේදනානු පස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා භාවනා වඩන විට පඤ්චස්කන්ධය හට නොගන්නා තත්වයකට ළඟාවිය හැකිය.

තමාට සුදුසු පහසු කායගතාසතිය, ධාතු මනසිකාර, ආනාපානාසතිය, සක්මන් භාවනාව වැනි භාවනාවන් හෝ අසුභ භාවනාවන් වැඩීමෙන්ද ගිරිමානන්ද සූත්‍රයේ ආදිනව සංඥා භාවනා වැඩීමෙන්ද රූප ස්කන්ධය පිළිබඳ ඡන්දරාගය දුරුකර ගත හැකිය.

ඒ නිසා පින්වතුනි තමාට සුදුසු පහසු භාවනා කමටහනක් තෝරා ගෙන දවසේ වැඩි වේලාවක් භාවනාවක යෙදීමෙන් මාර්ගඵලයක් නොලැබුනද සසරගමන කෙටි කර ගැනීමට එය ඉමහත් පිටුවහලක් වන්නේමය.

කායගතා සතිය වඩන විට මෙම කොටස් දැනගත යුතුයි. පාඩම් කරගන්න.

පඨවිධාතුවට අයත් කොටස් විස්සකි.
කෙස්, ලොම්, නිය, දත්, සම, මස්, නහර, ඇට, ඇට මිදුලු, වකුගඩු, හෘදය, යකනං කිලෝමකං, පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං, කරීසං, මත්ථලුංගං

ආපෝ ධාතුවට අයත් 12 කි.
පිත, සෙම, සැරව, ලේ, ඩයදිය, මේද, කඳුළු, වුරුණු තෙල්, කෙළ, සොටු, සඳමිදුළු, මුත්‍රා

**තේජෝ ධාතු කොටස් හතරකි.**
සන්තාපන තේජෝ ධාතුව, ජීරාපන තේජෝ ධාතුව, පරිදහන තේජෝ ධාතුව, පාචක තේජෝ ධාතුව

**වායෝ ධාතු කොටස් හයකි.**
උද්ධංගම වාතය, අධෝගම වාතය, කුච්ජිසය වාතය, කොට්ඨාශ වාතය, අංගමංගනනුසාරී වාතය, ආශ්වාස ප්‍රශ්වාස වාතය

## 7 වන වීථි පාළිය විමසා බලමු

අබ්‍යාකතො ධම්මෝ අබ්‍යාකතස්ස ධම්මස්ස හේතු පච්චයෙන් පච්චයෝ

විපාකබ්‍යාකතා කිරියාබ්‍යාකතා හේතු සම්පයුත්තකානං ඛන්ධානං චිත්ත සමුට්ඨානානඤ්ච රූපානං හේතු පච්චයෙන් පච්චයෝ

පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතා හේතු සම්පයුක්තකානං ඛන්ධානං කටත්තාච රූපානං හේතු පච්චයෙන් පච්චයෝ

අබ්‍යාකත හේතු වශයෙන් හඳුන්වන්නේ කුසල වශයෙන් ද නොගන්නා අකුසල වශයෙන්ද නොගන්නා ධර්මතාය. ඒ ආබ්‍යාකත ධර්ම වන්නේ විපාක, ක්‍රියා, රූප සහ නිබ්බාන යන සතරයි. මෙහිදී අබ්‍යාකත හේතු වශයෙන් සලකන අලෝභ, අදෝෂ, අමෝහ යන හේතු තුන සහේතුක විපාක සිත් සහ සහේතුක ක්‍රියා සිත් හට ගැනීම සඳහා ද උපකාර වෙනවා. මේ අලෝභ, අදෝස, අමෝහ යන හේතු තුන කුසල හේතුද වෙනවා. විපාක හේතුද වෙනවා. ක්‍රියා හේතුද වෙනවා. එනම් විපාක සිත් සමගද ක්‍රියා සිත් සමගද කුසල සිත් සමග ද හටගන්නවා.

මෙහි එන සමුට්ඨාන රූප ගත් විට ඒවා චිත්තජ රූප ඒ සමුට්ඨාන රූප දෙකක් තිබෙනවා.

1. ප්‍රතිසන්ධි විපාක අවස්ථාව හැර අන් විපාක අවස්ථා වලදී හටගන්නා චිත්තජ රූප
2. ක්‍රියා සිත් සමග හටගන්නා චිත්තජ රූප

පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතා හේතු සම්පයුක්තකානං

ප්‍රතිසන්ධි අවස්ථාවේ විපාක සිත හට ගැනීම සඳහා උපකාර වන, හේතු ඒවා කුසල හේතු හෝ අකුසල හේතු විය හැකියි.

එහිදී සමුට්ඨාන රූප වන්නේ කර්මජ රූපයි. එනම් පටිසන්ධි ක්ෂණයෙහි හටගන්නා කර්මජ රූප පටිසන්ධි කර්මජ රූප වශයෙන් හඳුන්වනවා.

පටිසන්ධි අවස්ථාවේ පටිසන්ධි සිත කියා හැඳින්වුවද සිත් අසූ නමය 89 තුළ ප්‍රතිසන්ධි සිත කියා සිතක් නැත. චිත්ත වීථි හා කෘත්‍ය සංග්‍රහයේ (අභිධර්ම මාර්ග පොතේ) පටිසන්ධි ක්ෂණය හෙවත් පටිසන්ධි සිත කියා හඳුන්වනවා. ඒ

පටිසන්ධි සිත විපාක අවස්ථාවක් එය කුසල විපාකයක් හෝ අකුසල විපාකයක් හෝ විය හැකිය.

මේ පටිසන්ධි අවස්ථාවේදී පටිසන්ධි සිත පමණක් නොවෙයි හටගන්නේ ඒ සිත සමග සම්ප්‍රයුක්තව හටගන්නා චෛතසික ධර්මත් පටිසන්ධි කර්මජ රූපත් හටගන්නවා. මේවා එකම ක්ෂණයකයි හටගන්නේ. මේ පටිසන්ධි ක්ෂණය තුළ සත්වයකු පුද්ගලයකු හටගන්නවා යයි සම්මුති වශයෙන් නම් කළත් භාග්‍යවතුන් වහන්සේ අවබෝධ කළේ හටගන්නේ චිත්ත, චෛතසික රූප සමූහයක් බවයි. ඒ අනුව මේ අවස්ථාවේ හටගන්නේ

විපාක සිත්

විපාක සිත් සමග සම්ප්‍රයුක්ත වන චෛතසික

ප්‍රතිසන්ධි කර්මජ රූප පමණක්මයි

ප්‍රතිසන්ධි කර්මජ රූප ගත් විට ඒවා ආකාර තුනක් වෙනවා. එනම් කාය දශක, වත්ථු දශක, භාව දශක රූපයි.

කාය දශකය - පඨවි, ආපෝ, වායෝ, තේජෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිතින්ද්‍රිය, කාය රූපය

භාව දශකය - පඨවි, ආපෝ, වායෝ, තේජෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිතින්ද්‍රිය, භාව රූපය

වත්ථු දශකය - පඨවි, ආපෝ, වායෝ, තේජෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිතින්ද්‍රිය, වත්ථු රූපය

මෙහිදී හටගන්නා රූප කලාප තිහ රූප ස්කන්ධය ලෙස සලකනවා.

කුසල හෝ අකුසල විපාක වශයෙන් යම් ප්‍රතිසන්ධි සිතක් ඇති වෙනවාද එය විඤ්ඤාණ ස්කන්ධය ලෙස සලකනවා.

හටගන්නා චෛතසික ධර්ම තුල ඇති වේදනා සහ සංඥා චෛතසික වේදනා ස්කන්ධය හා සංඥා ස්කන්ධ වෙනවා.

ඉතිරි චෛතසික සියල්ල සංස්කාර ස්කන්ධය වෙනවා

එනිසා මෙහිද හටගෙන ඇත්තේ රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ නම් වූ සංචස්කන්ධයයි.

හේතු පච්චය ඤාණේන - ඡබ්බණ්ණරංසි භාසුරං
සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයා මහං

## විඥානය පිළිබඳ භාවනාව

උපදවන කෙනෙකුද නොමැතිව තමාගේද ඉපදීමේ උත්සාහයක් නැතිව චක්ෂු

ප්‍රසාදයෙහි රූප ඡායා හැපීම නිසා චක්ඛු විඥානය උපදී. ඒ චක්ඛුවිඥානය තම චක්ඛු ප්‍රසාදයෙහි උපන් බව හෝ රූප දක්නා බව හෝ නොදනී. එබැවින් එය සත්ව පුද්ගල ආත්ම ස්වභාවයක් නැති විඥාන ධාතු මාත්‍රයක් පමණි.

උපදවන පුද්ගලයෙකු ද නොමැතිව තාමාගේ ද ඉපදීමේ උත්සාහයක් නැතිව ශ්‍රෝත්‍ර ප්‍රසාදයෙහි ශබ්දය හැපීම නිසා ශෝත්‍ර විඥානය උපදී. ඒ ශෝක විඥානය තමා ශ්‍රෝත්‍රප්‍රසාදයෙහි උපන් බව හෝ හඬ අසන බව හෝ ඇසූ හඬෙහි තේරුම හෝ නොදනී. එනිසා එය සත්ව පුද්ගල ආත්ම ස්වභාවයක් නැති විඥාන ධාතු මාත්‍රයක් පමණි. එසේම ඝාණ ප්‍රසාදය, ජිහ්වා ප්‍රසාදය, කාය ප්‍රසාදය ගැන ද භාවනාව සකසා ගෙන ඩවන්න.

උපදවන පුද්ගලයෙකු ද නොමැතිව තාමාගේ ද ඉපදීමේ උත්සාහයක් නැතිව මනෝද්වාරයේ ආරම්මණයන් හැපීම නිසා මනෝ විඥානය උපදී. ඒ මනෝ විඥානය තමා මනෝද්වාරයෙහි උපන් බව හෝ අරමුණු ගැන හෝ නොදනී. එබැවින් එහ සත්ව පුද්ගල ආත්ම ස්වභාව නැති ධාතු මාත්‍රයක් පමණි.

## විඤ්ඤාණ ධාතුව පිළිබඳ තවත් භාවනාවක්

අතීත භවයෙහි උපන් විඥාන ධාතු හු අතීත භවයේම නිරුද්ධ විය. වර්තමාන භවයට නොපැමිණියෝය. එබැවින් අනිත්‍යයෝය. ඉපදීම් බිඳීම් දෙකින් පෙළෙන බැවින් ද බියවිය යුතු බැවින්ද බිය ගෙනදෙන බැවින් ද දුකට ස්ථාන වන බැවින්ද දුකය. සාරයක් නැති බැවින් අනාත්මයෝය.

අනාගත භවයේ උපන් විඥාන ධාතු හු අනාගත භවයේම නිරුද්ධ වන්නේය. එබැවින් අනිත්‍යයෝය. ඉපදීම් බිඳීම් දෙකින් පෙළෙන බැවින් ද බියවිය යුතු බැවින්ද බිය ගෙනදෙන බැවින් ද දුකට ස්ථාන වන බැවින්ද දුකය. සාරයක් නැති බැවින් අනාත්මයෝය.

වර්තමාන භවයේ විඥාන ධාතු හු වර්තමාන භවයේම බිඳෙන්නාහ. අතීත භවයේ විඥානය පිළිබඳ භාවනා කළ ලෙසට සකස්කර ගෙන වඩන්න.

මෙසේ හේතු ප්‍රත්‍ය සලකා බැලීමේදී හේතු ධර්ම මොනවාද? හේතු ධර්ම තුළින් හටගන්නේ මොනවාද ඒ හටගන්නා නාම රූප ධර්මයන් නිරෝධයට පත් කර ගන්නේ කෙසේද යනාදී ලෙස හේතු ප්‍රත්‍යය ඉගෙනීමේ දී දැනගත යුතුයි. මේ සඳහා සීල සමාධි ප්‍රඥා වඩමින් නිරෝධය කරා ළඟා විය යුතුය. ඒ සඳහා පින්වත් සැම දෙනාටම පට්ඨාන ධර්මයේ පිහිට ලැබේවා.

## ආරම්මණ පච්චයෝති

සිතක් ඇති වීමට උපකාර වන දෙය අරමුණු නම් වේ. අරමුණක් නැතිව සිතක් නූපදී.චෛතසිකයෝද සිත හා බැඳී සිතට අනුව අරමුණු ගනිමින්ම තම තමන්ට අයත් කෘත්‍යයන් සිදු කරමින් උපදියි. චිත්ත චෛතසික ධර්මයන්ගේ ඉපදීමට මේ අරමුණු උපකාර වන නිසා එයට ආරම්මණ ප්‍රත්‍ය යයි කියනු ලැබේ.

නැඟී සිටීමට හැරමිටියක් උපකාර කරගන්නා සේ චිත්ත චෛතසිකයන්ගේ නැඟී සිටීමට හට ගැනීමට අරමුණක් උපකාර කරගත යුතුයි. අරමුණකින් තොරව සිතක හටගැනීමක් නැහැ. මොනවද මේ අරමුණු රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ සහ ධම්මයි. මේ අරමුණු උපකාර කරගෙන හටගන්න චිත්ත චෛතසික පිළිබඳව මේ ආරම්මණ ප්‍රත්‍ය තුළින් පැහැදිලි කරගමු.

මෙහිදී ප්‍රත්‍ය සහ ප්‍රත්‍යොත්පන්න ධර්ම අප දැන ගත යුතුයි. ප්‍රත්‍ය ධර්ම වන්නේ අරමුණු. ප්‍රත්‍යොත්පන්න වන්නේ එම අරමුණු නිසා හටගන්නා චිත්ත හා චෛතසිකයි. රූපායතන චක්ඛු විඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්ත කානංච ධම්මානං ආරම්මණ පච්චයේන පච්චයෝ වර්ණ රූපය අරමුණු කරගෙන චක්ඛු විඤ්ඤාණයත් (සම්ප්‍රයුක්ත ධර්ම) සබ්බ චිත්ත සාධාරණ චෛතසික හතක් එනම් ඵස්ස, වේදනා, සංඥා, චේතනා, ඒකග්ගතා, ජීවිතින්ද්‍රිය, මනසිකාර යන චෛතසික හතක් හටගන්නවා.

මෙහි හටගන්නා චක්ඛු විඤ්ඤාණය අහේතුක විපාක සිතක්. චක්ඛු විඤ්ඤාණ සිත් දෙකකි.

1. කුසල විපාක චක්ඛු විඤ්ඤාණ සිත
2. අකුසල විපාක චක්ඛු විඤ්ඤාණ සිත

මේ දෙකම අහේතුක විපාක සිත් දෙකක් අහේතුක විපාක සිත් ඉගෙන ගැනීමේදී දෙපස් විඤ්ඤාණ සිත් 10 ක් තියෙනවා. චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ යනාදී ලෙස අහේතුක කුසල විපාක සිත් පහක් හා අකුසල විපාක සිත් පහක් ලෙස සිත් 10 ක් හටගන්නවා. කාය විඤ්ඤාණ සිත කුසල් විපාකයේදී සුඛ සහගතයි. අකුසල විපාකයේදී දුක්ඛ සහගතයි. අනෙක් සිත් අටම උපේක්ෂා සහගතයි.

උපේක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය ආදී ලෙසයි.

රූපායතනය අරමුණු කොටගෙන චක්ඛු විඤ්ඤාණයන් සබ්බ චිත්ත චෛතසිකත් ඇතිවූවා සේ ශබ්දායතනය, ගන්ධායතනය, රසායතනය, පොට්ඨබ්බායතනය (පඨවි, වායෝ, තේජෝ) අරමුණු වී ශ්‍රෝත විඤ්ඤාණ, ඝාණ විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ යන සිත් හා චෛතසික ධර්මත් හටගන්නවා.

ඊළඟ ගාථාව බලමු.

රූපායතනං, සද්ධායතනං, ගන්ධායතනං, රසායතනං, ඵොට්ඨබ්බායතනං මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණ පච්චයේන පච්චයෝ

රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු උපකාරයෙන් මනෝධාතුවත් සම්පයුක්ත චෛතසිකත් හටගන්නවා.

පින්වතුනි චිත්ත විභාගයේදී සිත් 89 ක් කියා අපි ඉගෙන ගත්තා. මෙය කොටස් තුනකට බෙදෙනවා.

සිත් 89 ① මනෝධාතු, ② විඤ්ඤාණධාතු

③ මනෝ විඤ්ඤාණධාතු යනුවෙන් මනෝධාතුවට > පඤ්චද්වාරාවර්ජන සිත හා සම්පටිච්ඡන සිත් දෙකත් යන සිත් තුන අයත් වෙනවා. පඤ්ච ද්වාරාවර්ජනය යනු චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය යන සිත් හට ගැනීමට උපකාර කරන්නාවූ දොරටු පහෙන් කුමන දොරටුවකින් අරමුණක් පැමිණෙනවාද කියා සිහිකරන ආවර්ජනා කරන සිතයි.

සම්පටිච්ඡන සිත්වල ස්වභාවය වන්නේ පඤ්චද්වාරාවර්ජන සිතට පසුව ඇතිවන චක්ඛු විඤ්ඤාණයෙන් හඳුනාගත් රූපාරම්මණය පිළිගැනීමයි. එවැනි සම්පටිච්ඡන සිත් දෙකක් තිබෙනවා. එනම් අහේතුක අකුසල විපාක උපේක්ඛා සහගත සම්පටිච්ඡන සිත හා අහේතුක කුසල් විපාක උපේක්ඛා සහගත සම්පටිච්ඡන සිතයි. මේ පඤ්චද්වාරාවර්ජ්ජන සිතත් සම්පටිච්ඡන සිත් දෙකත් මනෝධාතු වශයෙන් හැඳින්වෙනවා.

මනෝ විඤ්ඤාණධාතු සිත් ලෙස සිත් 89 න් දෙපස් විඤ්ඤාණ සිත් 10 ක් මනෝධාතු සිත් තුනක් අඩු කළ විට ඉතිරි වන සිත් 76 හැත්තෑහය අයත් වෙයි. පින්වතුනි ඉහත ගාථාව මතක් කරගන්න. එහි රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු මනෝධාතුවට හා සම්ප්‍රයුක්ත ධර්ම වල ඇතිවීමට උපකාර වෙනවා.

මෙහිදී පඤ්චද්වාරාවජ්ජනය හා සම්පටිච්ඡන සිතුත් යන මනෝධාතු සිත් හා ඒ හා සම්ප්‍රයුක්ත වන ධම්මානං වන්නේ සබ්බචිත්තා සාධාරණ චෛතසික වන ඵස්ස, වේදනා, සංඥා, චේතනා, ඒකග්ගතා, ජීවිතින්ද්‍රිය, මනසිකාර යන 7 ත් ප්‍රකීර්ණක චෛතසික ධර්ම තුනත් විතක්ක, විචාර, අධිමොක්ඛ යන චෛතසිකත් එකටම මිශ්‍රව හටගන්නවා.

හේතු ප්‍රත්‍යය විස්තර කරන තැන අපි චක්ඛු ද්වාරික චිත්ත වීථියක් හඳුන්වා දුන් තැන පඤ්චද්වාරාවර්ජන සිත චක්ඛු විඤ්ඤාණ සිතට පෙර හටගන්නා සිතක් බව සඳහන් කළා. ඒ චිත්තවීථිය යළි මතක් කළොත් අතීතභවාංග → භවාංගචලන → භවාංග උපච්ඡේද → පඤ්චද්වාරාවර්ජන → චක්ඛු විඤ්ඤාණ → සම්පටිච්ඡන

චක්ඛු විඤ්ඤාණ සිත හටගැනීමට පෙර අරමුණ පැමිණියේ කුමන දොරටුවකින්ද යන්න ආවර්ජනය කරන සිත පඤ්චද්වාරාවජ්ජන සිතයි. එම සිත හට ගැනීමට රූපාරම්මනය උපකාරී වුනා. එම සිතට පසුව චක්ඛු විඤ්ඤාණ සිත හටගත්තා. චක්ඛු විඤ්ඤාණය විසින් හඳුනාගත් රූපාරම්මණය පිළිගැනීම සම්පටිච්ඡන සිත විසින් සිදු වනු ලබනවා. ඒ සිතත් හටගන්නේ රූපාරම්මණය අරමුණු කරගෙන පඤ්චද්වාරාවජ්ජන සිතත් සම්පටිච්ඡන සිතුත් අයත් වන්නේ මනෝධාතුවට

ඊළඟ ගාථාව බලමු.

සබ්බේ ධම්මා මනෝ විඤ්ඤාණ ධාතුයා
තං සම්ප්‍රයුත්ත කානඤ්ඤ ධම්මානං
ආරම්මණ පච්චයේන පච්චයෝ

මෙහි සබ්බේ ධම්මා යනු සියලුම අරමුණු යනුයි. එනම් අතීත වර්තමාන අනාගත කාලත්‍රයට අයිති රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ඒ වගේ රූප, චිත්ත චෛතසික නිවන යන සියලු අරමුණු ප්‍රත්‍ය කරගෙන මනො විඤ්ඤාණධාතුයා තං සම්ප්‍රයුක්තකානඤ්ච ධම්මානං

| | |
|---|---|
| අකුසල් සිත් 12<br>සන්තීරණ සිත් 3<br>අහේතුක ක්‍රියා සිත් 2<br>කාමාවචර කුසල, විපාක, ක්‍රියා සිත් 24<br>රූපාවචර කුසල, විපාක, ක්‍රියා සිත් 15<br>අරූපාවචර කුසල, විපාක, ක්‍රියා සිත් 12<br>ලෝකෝත්තර සිත් 8 | මනෝ විඤ්ඤාණ ධාතු සිත් 76 |

මේ සිත් හා චෛතසික පනස් දෙකම සම්ප්‍රයුක්ත එනම් ප්‍රත්‍යොත්පන්න ධර්ම වෙනවා.

මෙහි 12 ආකාර වූ අකුසල් සිත් අයත් වන්නේ විඤ්ඤාණ ස්කන්ධයට. එම අකුසල් සිත් 12 සමග අකුසල චෛතසික 27 ක් හටගන්නවා. එහි ඇති වේදනා චෛතසිකය වේදනා ස්කන්ධයට අයත් වෙනවා. සංඥා චෛතසිකය සංඥා ස්කන්ධය වෙනවා. ඉතිරි චෛතසික 25 විසි පහ සංඛාර ස්කන්ධයට අයත් වෙනවා. පින්වතුනි මෙතැන සිදුවන්නේ සත්වයෙකු පුද්ගලයෙකු නොවන ඇතිව නැතිව යන චිත්ත චෛතසික සමූහයක්. මෙහි සදාකාලිකව පවතින දෙයක් නැහැ. ඒ හටගන්නා සියලු චිත්ත චෛතසිකයෝ උත්පාද ඨිති භංග වශයෙන් බිඳී බිඳී ඇතිවෙමින් නැතිවෙමින් අනිත්‍ය ස්වභාවයට පත්වෙනවා. මේ නිසා ධාතු වශයෙන් හඳුන්වනවා.

කාමාවචර කුසල් සිත් අට හට ගන්නා හැටි විමසා බලමු. මේ සිත් අට පහළ වීමටත් අරමුණු ඉවහල් වෙනවා. මෙම කාමාවචර කුසල සිත් සමග චෛතසික 38 ක් තිස් අටක් පහළ වෙනවා. ඒ නාම ස්කන්ධ සමග චිත්තජ රූපත් හටගන්නවා. මේ අනුව විමසා බලන විට අරමුණු නිසා එතැන සිදුවන්නේ පංචස්කන්ධයේ හටගැනීමයි. මෙහි වේදනා චෛතසිකය, වේදනා ස්කන්ධයයි, සංඥා චෛතසිකය සංඥා ස්කන්ධයයි ඉතිරි චෛතසික සංඛාරා ස්කන්ධයයි හටගන්නා සිත විඤ්ඤාණ ස්කන්ධයයි. චිත්තජ රූප රූපස්කන්ධයයි. පින්වතුනි හැම අරමුණකදීම පංචස්කන්ධ හටගන්නා බවත් සත්වයෙකු පුද්ගලයෙකු නැති බවත් ඒ ඇතිවන සෑම රූප නම් චිත්තක්ෂණ 17 ක් තුළ නාම ස්කන්ධ චිත්තක්ෂණයක් තුළ ඇති වී නැති වී යන බවත් මෙහි පුද්ගලයෙකු නැත. හේතුඵල සබඳතාවක් පමණක් බව සිතමින් විදර්ශනා වැඩිය යුතුය.

**ආරම්මණ ප්‍රත්‍යයේ විසර්ජනාවාර නමයකි.**

**1. කුසලෝ ධම්මෝ කුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයේන පච්චයෝ**

දාන ශීල භාවනා ආදී කුසල ක්‍රියා සිදුකර ඒවා මෙනෙහි කරමින් කුසල සිත් උපදවා ගත හැකි බවයි.

**2. කුසලෝ ධම්මෝ අකුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයේන පච්චයෝ**

දානය වැනි පිනක් සිදු කරල ඒ පිළිබඳව මානයක්, නැතිනම් වියදම් කළා වැඩියි යනාදී අරමුණු නිසා අකුසල් සිත් ඉපදීමයි.

**3. කුසලෝ ධම්මෝ අඛ්‍යාකතස්ස ධම්මස්ස ආරම්මණ පච්චයේන පච්චයෝ**

කුසල ධර්මය හෙවත් කුසල් සිත් විසි එක අව්‍යාකෘත ධර්ම හෙවත් විපාක ක්‍රියා චිත්තයන්ට ආරම්මණ ප්‍රත්‍ය ශක්තියෙන් උපකාර වෙන බවයි.

**4. අකුසලෝ ධම්මෝ අකුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයේන පච්චයෝ**

අකුසල අරමුණු දැකල මෙනෙහි කරල අකුසල් සිතුවිලි රාග, ද්වේශ, මෝහ ආදී අකුසල් සිත් හා චෛතසික ඇතිකර ගන්න අවස්ථා ඇත.

**5. අකුසලෝ ධම්මෝ කුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයේන පච්චයෝ**

අකුසල ක්‍රියාවක් මෙනෙහි කරමින් අනිත්‍ය දුක්ඛ අනාත්ම ආදී වශයෙන් විදර්ශනා වැඩීමට පුළුවන.

**6. අකුසලෝ ධම්මෝ අඛ්‍යාකතස්ස ධම්මස්ස ආරම්මණ පච්චයේන පච්චයෝ**
**7. ආඛ්‍යාතො ධම්මෝ අඛ්‍යාකතස්ස ධම්මස්ස ආරම්මණ පච්චයේන පච්චයෝ**
**8. ආඛ්‍යාතො ධම්මෝ කුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයේන පච්චයෝ**
**9. ආඛ්‍යාතො ධම්මෝ අකුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයේන පච්චයෝ**

ආරම්මණ ඤාණජාත - ජබ්බණ්ණ රංසි භාසුරං
සම්බුද්ධං සබ්බ දස්සාවිං වන්දාමි පූජයා මහං

**- පට්ඨාන ධම්මෝ චිරං තිට්ඨතු -**

සූවිසි ප්‍රත්‍ය හා ඒවා නිසා පහළවන නාම රූප ධර්ම ගැන තේරුම් ගැනීමට සිත් පිළිබඳව, චෛතසික පිළිබඳව, රූප ධර්ම පිළිබඳව පංචස්කන්ධය,

පටිච්ච සමුප්පාදය, කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනාව, ධම්මානුපස්සනාව (සතර සති පට්ඨානය) දස සංයෝජන ආදිය පිළිබඳව යම් අවබෝධයක් තිබිය යුතුය. චෛතසික, රූප යන පරමාර්ථ ධර්ම හතර කෙටියෙන් විමසා බලමු.

අභිධර්මය භාගවතුන් වහන්සේගේ පරමාර්ථ දේශනාවය.

චිත්තය, චෛතසිකය රූපය නිර්වාණය යයි පරමාර්ථ ධර්ම හතරකි. මේ හතරින් පළමු කොට ඉගෙන ගත යුත්තේ සිත ගැනය. සිත එකක් ලෙස පෙනුනද අභිධර්මය ඉගෙන ගැනීමේදී සිතේ හැටි හරිහැටි අවබෝධ කර ගැනීමට සිත එක් ක්‍රමයකට අසූ නමයක් ලෙසද විස්තර ක්‍රමයට ගතහොත් සිත් 121 ක් ලෙසද අභිධර්මයේ සඳහන් වෙයි. සිත බෙදෙන්නේ භූමි ජාති වශයෙනි.

සාමාන්‍යයෙන් එකක් වූ සිත කාමාවචර සිතය, රූපවචර සිතය, අරූපාවචර සිතය, ලෝකෝත්තර සිතය යනුවෙන් භූමි වශයෙන් හතරකට බෙදනු ලැබේ.

අපාය හතර (4), මිනිස් ලොව (1), දිව්‍යලෝක හය (6) යන මේ භූමි එකොළසට කාම භූමි යයි කියනු ලැබේ. කාම භූමියට අයත් වන සිත කාමාවචර නම් වේ.

පසළොස් වැදෑරුම් රූප භූමියට අයත් සිත රූපවචර නම් වෙයි.

අරූප භූමි හතරකි. එම අරූප භූමියට අයත් සිත අරූපාවචර නම් වෙයි.

ඉහත භූමි තුනට අයත් නැති ලෝකෝත්තර භූමියට අයත් සිත ලෝකෝත්තර නම් වේ.

කාමාවචර සිත් සිවු පනසකි. 54 කි.
රූපාවචර සිත් පහළොවකි. 15 කි.
අරූපාවචර සිත් දොළොසකි. 12 කි.

ලෝකෝත්තර සිත් කෙටි ක්‍රමයට 8 කි. විස්තර ලෙස 40 කි. මේ අනුව කෙටි ක්‍රමයට සිත් 89 කි. විස්තාර ක්‍රමයට 121 කි.

**කාමාවචර සිත් 54**

**අශෝභන 30** | **ශෝභන 24**

**අකුසල් සිත් 12** | **අහේතුක සිත් 18**

කාමාවචර සිත් සිවුපනස (54)

අකුසල් සිත් දොළොස 12 } **අශෝභන**
අහේතුක සිත් දහඅටකි 18 }
කාමාවචර ශෝභන සිත් විසි හතරකි 24
කාමාවචර සිත් $12 + 18 + 24 = 54$ පනස් හතරකි.

## අකුසල් සිත්

යමෙකුගේ සන්තානයෙහි ඇති වුවහොත් අනාගතයෙහි ඔහුට අනිෂ්ට විපාක ඇති කරවන්නාවූ සිත් අකුසල් සිත් නම් වේ. ලෝභ ද්වේශ, මෝහ කියා අකුසල් මුල් (චෛතසික) තුනකි. ඒ නිසා ලෝභ මූල සිත, ද්වේශ මූල සිත, මෝහ මූල සිත කියා තුනකට බෙදේ. ලෝභ සිත සෝමනස්ස සහගත සිතය උපේක්ෂා සහගත සිතය කියා නැවත දෙකකට බෙදෙයි. එසේම මේ සිත්වල දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත හා දෘෂ්ටිගත විප්‍රයුක්ත කියා නැවත කොටස් දෙකකට බෙදේ. දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත යනු මෙලොව සහ පරලොව නැත. පින් හා පවු කියා දෙයක් නැත යනාදි ලෙස මිථ්‍යා දෘෂ්ටියෙන් යුක්ත සිතයි. මොලොව පරලොව ඇත, පින් හා පවු ඇත ආදී ලෙස සිතුවොත් එය දෘෂ්ටිගත විප්‍රයුක්ත සිතකි. එම සම්ප්‍රයුක්ත හෝ විප්‍රයුක්ත සිත් නැවත අසංස්කාරික, සසංස්කාරික යනුවෙන් කොටස් දෙකකට බෙදේ. ලෝභ ද්වේශ මෝහ චෛතසික මුල් වී කරන අකුසලය කාගේවත් මෙහෙය වීමක් නැතිව තම සිතින්ම කරන විට අසංස්කාරික කියාද අනුන් කියන නිසා කරන අකුසලය සසංස්කාරික කියාද හඳුන්වයි. ඒ අනුව සෝමනස්ස සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත හිතද විප්‍රයුක්ත හිතද උපේක්ෂා සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත සිතද විප්‍රයුක්ත සිතද අසංඛාරික සසංස්කාරික වශයෙන් බෙදීමට ලක්වෙයි.

## ඒ අනුව ලෝභ මූල සිත් අටකි

සෝමනස්ස සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත අසංඛාරික සිත
සෝමනස්ස සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත සසංඛාරික සිත
සෝමනස්ස සහගත දෘෂ්ටිගත විප්‍රයුක්ත අසංඛාරික සිත
සෝමනස්ස සහගත දෘෂ්ටිගත විප්‍රයුක්ත සසංඛාරික සිත
උපේක්ෂා සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත අසංඛාරික සිත
උපේක්ෂා සහගත දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත සසංඛාරික සිත
උපේක්ෂා සහගත දෘෂ්ටිගත විප්‍රයුක්ත අසංඛාරික සිත
උපේක්ෂා සහගත දෘෂ්ටිගත විප්‍රයුක්ත සසංඛාරික සිත

## ද්වේෂ මූල සිත් දෙකකි

දෝමනස්ස සහගත ප්‍රතිඝ සම්ප්‍රයුක්ත අසංඛාරික සිත
දෝමනස්ස සහගත ප්‍රතිඝ සම්ප්‍රයුක්ත සසංඛාරික සිත

## මෝහ මූල සිත් දෙක

මෝහ මූල සිතේ මෝහය බලවත් වෙයි. පින්පව් මෙලොව පරලොව ආදිය ගැන ඇතිවන සැකය විචිකිච්ඡා නම් වේ. සිතෙහි නොසන්සුන්ගතිය උද්දච්ච නම් වේ.

උපේක්ෂා සහගත විචිකිච්ඡා සම්ප්‍රයුක්ත සිත
උපේක්ෂා සහගත උද්දච්ච සම්ප්‍රයුක්ත සිත

ලෝභ මූල සිත් අටකි. ද්වේශ මූල සිත් දෙකකි. මෝහ මූල 2 කි.

## අහේතුක සිත් දහ අට

බුදු දහමෙහි ලෝභ, ද්වේෂ, මෝහ, අලෝභ, අද්වේෂ, අමෝහ යන චෛතසික ධර්ම හයට හේතු යන නම ව්‍යවහාර කරනු ලැබේ. මේ හේතු හයෙන් එකක් හෝ යෙදෙන සිතට සහේතුක සිත් යනුවෙන් කියනු ලැබේ. මෙම හේතු සයෙන් එකක් හෝ හේතු නොයෙදෙන සිත් වලට අහේතුක සිත් යයි කියනු ලැබේ.

අහේතුක සිත් 18 කි. එය කොටස් තුනකට බෙදේ.

කුසල විපාක අටකි.
අකුසල විපාක හතකි
අහේතුක ක්‍රියා සිත් තුනකි

විපාක යනු කුසල අකුසල කළ තැනැත්තාගේ සන්තානයෙහි එම පින් පව් නිසා අනාගතයෙහි ඇතිවන සිත්ය. කුසලා කුසලයන්ගේ බලයෙන් අනාගතයෙහි ඇති කරවන සිත්ය.

### අහේතුක කුසල විපාක සිත් අටකි.

උපේක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය
උපේක්ඛා සහගත සෝත විඤ්ඤාණය
උපේක්ඛා සහගත ඝාන විඤ්ඤාණය
උපේක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණය
සුඛ සහගත කාය විඤ්ඤාණය
උපේක්ඛා සහගත සම්පටිච්ඡනය
සෝමනස්ස සහගත සන්තීරණය
උපේක්ඛා සහගත සන්තීරණය

### අහේතුක අකුසල විපාක හතකි

උපේක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය
උපේක්ඛා සහගත සෝත විඤ්ඤාණය
උපේක්ඛා සහගත ඝාන විඤ්ඤාණය
උපේක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණය
දුක් සහගත කාය විඤ්ඤාණය
උපේක්ඛා සහගත සම්පටිච්ඡනය
උපේක්ඛා සහගත සන්තීරණය

### අහේතුක ක්‍රියා සිත් තුන

මෙහි සිත් වලින් සිදුකෙරෙන කාර්යය අනුව මේ සිත් වලට නම් තබා ඇත.

මේ අහේතුක ක්‍රියා සිත් තුනකි.

උපේක්ඛා සහගත පඤ්චද්වාරාවජ්ජනය
උපේක්ඛා සහගත මනෝද්වාරාවජ්ජනය
සෝමනස්ස සහගත හසිතුප්පාදය යනු අහේතුක සිත් තුනය

ඇස, කන, නාසය, දිව, කය යන මේ සිත් උපදනා ස්ථානවලට ද්වාර යයි කියනු ලැබේ. චිත්ත සන්තානයට රූපාදී අරමුණු ඇතුළු වන්නේ ඒ ද්වාර වලිනි. චක්ෂුරාදී ද්වාර පසින් යම් දෙයකට අරමුණක් පැමිණියහොත් එකෙණෙහිම ඒ අරමුණු මනෝද්වාරයේද සැපේ. එයින් භවාංග සිත් ඉපදීම නැවතී ද්වාරයක යම්කිසි අරමුණක් ගැටුණු බව දැනගන්නා සිතක් පහළ වෙයි. ඒ සිතට පඤ්චද්වාරාවර්ජන යයි කියලු ලැබේ. පඤ්ච ද්වාරයෙහි ගැටීමෙක් නොවී කෙළින්ම මනෝද්වාරයටද අරමුණු පැමිණේ. එසේ පැමිණෙන අරමුණු සම්බන්ධයෙන් මුළින්ම පහළ වන සිත මනෝද්වාරාවජ්ජන නම් වේ. භවාංග චිත්තය යයි කියන සත්වයාගේ ප්‍රකෘති චිත්තය හා තවත් බොහෝ සිත් ද ඇති වන්නේ හෘදය කෝෂයෙහිය. හෘදය කෝෂයෙහි පවත්නාවූ භවාංග චිත්ත පරම්පරාවට මනෝද්වාරයයි කියනු ලැබේ. නානා කරුණු සම්බන්ධයෙන් නොයෙක් සිත් නැගි නැගී එන්නේ හෘදය කෝෂයෙහි පවත්නා භවාංග චිත්තයෙනි.

හසිතුප්පාද චිත්තය යනු සිනා උපදවන සිතය. කුසල විපාක සිත් අටය අකුසල විපාක සිත් හතය ක්‍රියා සිත් තුන යයි අහේතුක සිත් දහ අටකි. (18 කි)

අහේතුක සිත් දුබල කොටසක් නිසා ඒවායේ සංඛාර භේද්‍යයක් අභිධර්මයෙහි දක්වා නැත. අහේතුක සිත් 18 ම අසංඛාරික ලෙස ගනන් ගනු ලැබේ. අකුසල සිත් 12 සහ අහේතුක සිත් 18 ට අශෝභන සිත් යයි කියනු ලැබේ. ඉතිරි සිත් 59 ට විස්තාර ක්‍රමයෙන් 91 ක් වූ සිත්වලට ශෝභන සිත් යයි කියනු ලැබේ.

## කාමාවචර කුසල් සිත් අට

දන්දීම සිල් රැකීම ආදී වශයෙන් සාමාන්‍ය ජනයා කරන කුසල් කාමාවචර කුසලයයි. ශ්‍රද්ධාව බලවත්ව දාන වස්තු ඉතා හොඳින් දීමට අවස්ථාව ඇති විටෙක ඒ කුසල චිත්තය සෝමනස්සයෙන් යුක්තවද ඒවා නොලත් අවස්ථාවලදී කුසල චිත්තය උපේක්ඛා සහගතව ද ඇතිවේ. විටෙක එම කුසල චිත්තය කර්ම ඵල ආදිය විශ්වාස ඇතිව කරන විට ඤාන සම්ප්‍රයුක්ත යනුවෙන්ද කර්ම ඵලාදිය පිළිබඳව

විශ්වාස නැතිවිට එම කුසල චිත්තය විප්‍රයුක්ත යනුවෙන් දෙකට බෙදේ. උපේක්ඛා සහගත සිතද එසේ දෙකට බෙදේ. ඒ සතරින් එක එකක් නැවත සංස්කාර භේදයෙන් දෙකට දෙකට බෙදේ. ඒ අනුව කාමාවචර කුසල් සිත් අටකි.

සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිත
සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත සසංඛාරික සිත
සෝමනස්ස සහගත ඥාන විප්‍රයුක්ත අසංඛාරික සිත
සෝමනස්ස සහගත ඥාන විප්‍රයුක්ත සසංඛාරික සිත
උපේක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිත
උපේක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත සසංඛාරික සිත
උපේක්ෂා සහගත ඥාන විප්‍රයුක්ත අසංඛාරික සිත
උපේක්ෂා සහගත ඥාන විප්‍රයුක්ත සසංඛාරික සිත

මෙම කාමාවචර කුසලයට මහා කුසලය යනුවෙන් ද කියනු ලැබේ. එසේ කියන්නේ ලෝකයේ බොහෝ දෙනෙකුට ඇතිවන කුසලය නිසයි. දශ පුණ්‍ය ක්‍රියාවලදී ඇතිවන චේතනා අනුව කාමාවචර කුසල් සිත් අසූවක් (80) වෙයි. මේ සිත් අතුරින් සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිත බලවත්ය. එහිදී ලැබෙන කුසලය වැඩියි.

## සහේතුක කාමාවචර විපාක සිත් අටකි

සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිත
සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත සසංඛාරික සිත
සෝමනස්ස සහගත ඥාන විප්‍රයුක්ත අසංඛාරික සිත
සෝමනස්ස සහගත ඥාන විප්‍රයුක්ත සසංඛාරික සිත
උපේක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිත
උපේක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත සසංඛාරික සිත
උපේක්ෂා සහගත ඥාන විප්‍රයුක්ත අසංඛාරික සිත
උපේක්ෂා සහගත ඥාන විප්‍රයුක්ත සසංඛාරික සිත

සහේතුක කාමාවචර ක්‍රියා සිත් අට

සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිත
සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත සසංඛාරික සිත
සෝමනස්ස සහගත ඥාන විප්‍රයුක්ත අසංඛාරික සිත
සෝමනස්ස සහගත ඥාන විප්‍රයුක්ත සසංඛාරික සිත
උපේක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සිත

උපේක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත සසංඛාරික සිත
උපේක්ෂා සහගත ඥාන විප්‍රයුක්ත අසංඛාරික සිත
උපේක්ෂා සහගත ඥාන විප්‍රයුක්ත සසංඛාරික සිත කියා සිත් අටකි.

රහතන් වහන්සේලා දන්දීම සිල් රැකීම, භාවනා කිරීම වැනි පිංකම් කරති. රහතුන් වහන්සේලා එම පුණ්‍ය කර්ම කරන විට ඒ ඒ ක්‍රියා සිදු කිරීමේ මාත්‍රය පමණක් ඇති බැවින් එහිදී ඇතිවන සිත්වලට සහේතුක කාමාවචර ක්‍රියා සිත් යයි කියනු ලැබේ. කාමාවචර කුසල් සිත් අටය, සහේතුක කාමාවචර විපාක සිත් අටය, සහේතුක කාමාවචර ක්‍රියා සිත් අටයයි. කාමාවචර ශෝභන සිත් විසි හතරකි. අකුසල සිත් දොළහය. අහේතුක සිත් දහඅටය, කාමාවචර ශෝභන සිත් විසි හතරයි (24) යනුවෙන් කාමාවචර සිත් පනස් හතරකි.

## රූපාවචර සිත් පසළොස

රූපාවචර, අරූපාවචර ලෝකෝත්තර යන සිත් තුන් වර්ගය පෙර පින් හා මහා වීර්ය ඇති උසස් පුද්ගලයන් ටික දෙනෙකුට පමණක් ඇතිවන විශේෂ සිත් කොටසකි.

රූපාවචර චිත්තය කුසල විපාක ක්‍රියා වශයෙන් කොටස් තුනකි. එසේම මේවාට ධ්‍යාන සිත් කියාද කියනු ලැබේ. මේවා කාමාවචර සිත්වලට වඩා බලවත් වෙයි.

## රූපාවචර කුසල් සිත් පස

විතක්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත ප්‍රථම ධ්‍යාන සිත
විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත ද්විතීය ධ්‍යාන සිත
ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත තෘතිය ධ්‍යාන සිත
සුඛ ඒකග්‍රතා සහිත චතුර්ථ ධ්‍යාන සිත
උපේක්ෂා ඒකාග්‍රතා සහිත පඤ්චම ධ්‍යාන සිත

## රූපාවචර විපාක් සිත්

රූපාවචර ධයාන උපදවා ගත් තැනැත්තා ධයානය නොපිරිහී කලුරිය කළහොත් ඒ අනුභාවයෙන් බ්‍රහ්ම ලෝකයේදී උපදනා ධ්‍යාන සිත් රූපාවචර විපාක සිත්ය. රූපාවචර විපාක සිත් ද පසක් ඇත්තේය.

විතක්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත ප්‍රථම ධ්‍යාන සිත යනාදී වශයෙන් රූපාවචර විපාක සිත් ද පසකි.

## රූපාවචර ක්‍රියා සිත්

රූපාවචර ධ්‍යාන සිත්වල මතු විපාක ඇති කිරීමේ ශක්තිය නැති බැවින් රූපාචර ක්‍රියා නම් වෙයි. රූපාවචර ක්‍රියා සිත්ද විතර්ක විචාර ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත ප්‍රථම ධ්‍යාන සිත යනාදීන් කුසලය සේම පහකි. මේවායේ අසංකාරික සසංඛාරික භේදයක් නැත.

## අරූපාවචර සිත් දොළොසකි

රූපයන්ගෙන් ඈත් කොට ශාන්ත බවට පත් කරන ලද පංචම ධ්‍යාන චිත්තය 'අරූපාවචර චිත්තය යයි කියනු ලැබේ. එම සිතද කුසල, විපාක, ක්‍රියා වශයෙන් තුනකට බෙදෙයි.

## අරූපාවචර කුසල් සිත් හතර

ආකාසනඤ්චායතන කුසල් සිත
විඤ්ඤාණඤ්චායතන කුසල් සිත
ආකිඤ්චඤ්ඤායතන කුසල් සිත
නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසල් සිත යනුවෙන් හතරකි. අරූපාවචර සිත් උපදවා ගත හැක්කේ රූපාවචර පඤ්චමධ්‍යානය උපදවාගත් අයට පමණි.

රූපාවචර ධයාන ලබාගත් ඇතැමෙක් රූපකාය නිසා සත්වයාට බොහෝ දුක් ඇතිවන බව දැක රූපකාය කෙරෙහි කලකිරී අරූපී ආත්ම භාවයක් පතා අරූප ධයාන උපදවති.

## අරූපාවචර විපාක් සිත්ද හතරකි

ආකාසනඤ්චායතන ක්‍රියා සිත
විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සිත
ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා සිත
නේවසඤ්ඤානාසඤ්ඤායතන විපාක සිත

කාම රූප ලෝක දෙකෙහි සත්වයන්ගේ විඤ්ඤාණය පවත්නේ රූප කය ඇසුරු කරගෙනය. රූපකයක් නොමැතිව පැවතීමට ඒවාට ශක්තිය නැත.

අරූපාවචර විපාක වනාහි රූපයෙන් තොරව පැවතිය හැකි පරිදි දියුණු වූ ඒවාය. ඒනිසා අරූප ප්‍රතිසන්ධි චිත්තය සමග රූපකයක් ඇති නොවේ. විඤ්ඤාණයෙන් ඔවුහු ඉතා දීර්ඝ කාලයක් ජීවත් වෙති. රූප කය නිසා අප විඳින දුක් අරූපී සත්වයාට නැත.

## අරූපාවචර ක්‍රියා සිත් ද හතරකි.

ආකාසනඤ්චායතන ක්‍රියා සිත
විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සිත
ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා සිත
නේවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා සිත

මෙසේ අරූපාවචර සිත් කුසල්, විපාක, ක්‍රියා වශයෙන් දොළසකි. උසස් පුද්ගලයන් විසින්ම උපදවනු ලබන සිත් කොටසක් බැවින් මේ රූපාවචර අරූපාවචර සිත්වලට මහග්ගත සිත් යන නාමය කියනු ලැබේ. මහග්ගත සිත් 27 කි. රූපාවචර සිත් 15 + අරූපාවචර සිත් 12 = 27 කි.

කාමාවචර සිත් පනස් හතරය. රූපාවචර සිත් පහලොවය. අරූපාවචර දොලසය යන මේ සිත් අසූ එකට ලෞකික සිත් යයි කියනු ලැබේ.

## ලෝකෝත්තර සිත් අට

සසර දුකින් මිදීමට කැමති අය සම්මාදිට්ඨි සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන අරි අටග මගෙහි යමින් විදර්ශනා භාවනාවෙහි යෙදෙති. එය නිතර වඩන යෝගාවචරයාගේ සිතෙහි එම ධර්මයෝ ක්‍රමයෙන් දියුණු වෙති. මතු කවර කලෙක වත් ඇති නොවන ලෙස කෙලෙසුන් නැසිය හැකි තරමට දියුණු වූ ආර්ය අෂ්ටාංගික මාර්ගය සත්වයාට ලෝකයෙන් එතෙර කොට නිවනට පමුණුවන බැවින් ලෝකෝත්තර මාර්ගයෙන් යුක්ත වන සිතට ලෝකෝත්තර මාර්ගය යන නමද එම සිතට ලෝකෝත්තර සිත කියාද කියනු ලැබේ. මෙම ලෝකෝත්තර මාගර්ය සතර වාරයක් තුළ ඇතිවෙයි.

සෝතාපත්ති මග්ග චිත්තය
සකෘදගාමී මග්ග චිත්තය
අනාගාමී මග්ග චිත්තය
අරහත් මග්ග චිත්තය කියා ලෝකෝත්තර කුසල් සිත් හතරකි.

## ලෝකෝත්තර ඵල සිත් හතරකි

සෝතාපත්ති ඵල චිත්තය
සකෘදගාමී ඵල චිත්තය
අනාගාමී ඵල චිත්තය
අරහත්ත ඵල චිත්තය කියා ලෝකෝත්තර විපාක සිත් හතරකි. ලෝකෝත්තර කුසලය ලෞකික කුසලයක් මෙන් කල්පසු කොට විපාක ලබාදෙන දෙයක් නොව එකෙණෙහිම විපාකය ඇති කරන කුසලයකි.

## මෙසේ කාමාවචර සිත් පනස් හතරය 54

රූපාවචර සිත් පහලොවය 15
අරූපාවචර සිත් දොළහය 12
ලෝකෝත්තර සිත් අටය 8 යනුවෙන් කෙටි ක්‍රමයට සිත් ගණන අසූනවයකි. 89 කි. විස්තාර ක්‍රමයට සිත් ගණන එකසිය විසි එකකි. 121 කි. එම ක්‍රමයද දැනගත යුතුය. සිත් අසූනමය තුළ දැක්වූ ලෝකෝත්තර සිත් අට විස්තර ක්‍රමයට හතළිහක් (40) වෙයි. එය මෙසේ මතක තබා ගන්න.

විතක්ක විචාර ප්‍රීති සුඛ ඒකග්ගතා සහිත ප්‍රථම ධ්‍යාන සෝතාපත්ති මග්ග චිත්තය

විචාර, ප්‍රීති, සුඛ ඒකග්ගතා සහිත ද්‍රුතිය ධ්‍යාන සෝතාපත්ති මග්ග චිත්තය
ප්‍රීති, සුඛ ඒකග්ගතා සහිත තෘතිය ධ්‍යාන සෝතාපත්ති මග්ග චිත්තය
සුඛ ඒගග්ගතා සහිත චතුත්ථ ධ්‍යාන සෝතාපත්ති මග්ග චිත්තය
උපේක්ඛා ඒකග්ගතා සහිත පඤ්චම ධ්‍යාන සෝතාපත්ති මග්ග චිත්තය

මේ සිත් පස (5) සෝතාපත්ති මග්ග චිත්තයෝය.

මෙලෙසට සකෘදගාමී මාර්ග සිත් ද පහකි. (5) කි.

අනාගාමී මාර්ග සිත් ද පහකි. (5)
අරහත් මාර්ග සිත්ද පහකි. (5)

මෙසේ ලෝකෝත්තර කුසල් සිත් විස්සකි. එසේම ඵල සිත් ද විපාක් සිත් ද විස්සකි. එය මෙසේය. විතක්ක විචාර ප්‍රීති සුඛ ඒකග්ගතා සහිත ප්‍රථම ධ්‍යාන සෝතාපත්ති ඵල චිත්තය විචාර ප්‍රීති සුඛ ඒකග්ගතා සහිත ද්‍රුතිය ධ්‍යාන සෝතාපත්ති ඵල සිතය. ප්‍රීති සුඛ ඒකග්ගතා සහිත තෘතිය ධ්‍යාන සෝතාපත්ති

ඵල සිත සුඛ ඒකග්ගතා සහිත චතුත්ථධ්‍යාන සෝතාපත්ති ඵල සිත උපේක්ඛා ඒකග්ගතා සහිත පඤ්චම ධයාන සෝතාපත්ති ඵල සිත

මෙසේ සෝවාන් මග්ග චිත්තය ධ්‍යාන භේදය අනුව පහක් වූවාක් මෙන් සෝවාන් ඵල සිතද ධයාන භේදය අනුව පහක් වූවා මෙන් සකෘදගාමී මග්ග චිත්තය ධයාන භේදය අනුව පහක් වන අතර ඵල සිත්ද ධ්‍යාන භේදය අනුව පසකි. ඒ අනුව අනාගාමී මග්ග සිත් පහක් හා ඵල සිත් පහක් වන අතර අරහත් මාර්ග සිත් පහක්ද ඵල සිත් පහක්ද වන නිසා ලෝකෝත්තර සිත් හතළිහක් ලෙස සලකන විට විස්තාර ක්‍රමයට ලෝකෝත්තර සිත් එකසිය විසි එකකි. (121 කි)

## චෛතසික පනස් දෙක

මඳකුදු පෙර පසු නොවී සිත හා එකට ඉපදීමය. එකටම නිරුද්ධ වීමය. සිතින් ගන්නා අරමුණම ගැනීමය. සිත උපදනා තැනම ඉපදීමය යන කරුණු සතරින් සිත හා සම්ප්‍රයෝග වන ධර්මයෝ චෛතසික නම් වෙයි.

සම්ප්‍රයෝග වීම යනු කවර ආකාරයකින්වත් වෙන් කළ නොහෙන පරිදි මිශ්‍රවීමයි.

චෛතසික පනස් දෙකකි. ඒ සියල්ල එක සිතක් සමග එකවරම උපදින්නේ නැත. එක් එක් සිතක් සමග උපදින්නේ ඒ සිතට අයත් කෘත්‍යය සිදු කිරීමට උවමනා චෛතසික පමණි. ආලෝකය හා අන්ධකාරය මෙන් එකිනෙකට විරුද්ධ චෛතසික ද ඇත්තේය. අන්‍යෝන්‍ය විරුද්ධ චෛතසිකයෝ කිසි කලෙක එකට නූපදිති.

එක සිතක් සමග එකවරකට උපදනා වැඩිම චෛතසික ගණන සතිසකි (36) කි.

චෛතසික වල සයෝගය නොමැතිව සිතක් ද උපදින්නේ නැත. සිතේ සහාය නැතිව චෛතසිකද නූපදී. සිතක් උපදින විට ඒ සිතින් සිදුකරන කෘත්‍යය සිදු කිරීමට උවමනා චෛතසික සමූහයක් ඒ සිත සමගම උපදී.

සිත් උපදනා ස්ථාන හයකි. යම්කිසි ස්ථානයක සිත උපදීනම් ඒ සිත හා උපදින චෛතසිකයෝද ඒ ස්ථානයේම ඒ වස්තුවට ඇසුරු කරගෙන උපදී. අන්‍ය සමාන රාශිය, අකුසල රාශිය ශෝභන රාශියය කියා චෛතසික රාශි තුනකි. සර්ව චිත්ත සාධාරණ චෛතසික හතය, ප්‍රකීර්ණක චෛතසික සයය කියා අන්‍ය සමාන

රාශියට අයත් චෛතසික දහතුනකි. අකුසල රාශියට අයත් චෛතසික තුදුසකි. (14 කි) ශෝභන සාධාරණ චෛතසික එකුන් විස්සකි. 19 කි. (විස්සට එකක් අඩු එකුන් විස්ස) විරති චෛතසික තුනකි. අප්‍රමාණ්‍ය චෛතසික දෙකකි. ප්‍රඥා චෛතසිකය යන චෛතසික විසි පහ ශෝභන රාශියට අයත් චෛතසිකයෝය.

## සබ්බචිත්ත සාධාරණ චෛතසික හත

ඵස්ස, වේදනා, සඤ්ඤා, චේතනා, ඒකග්ගතා, ජීවිතින්ද්‍රිය, මනසිකාරය යයි සර්ව චිත්ත (සබ්බ චිත්ත සාධාරණ චෛතසික හතකි. (තව ලෙසකට කිවහොත් වේදනා ස්කන්ධය, සඤ්ඤා ස්කන්ධය, සංස්කාර ස්කන්ධය කියන්නේද චෛතසික පනස්දෙකටය.) කුසලාකුසලාදී වශයෙන් විශේෂයක් නොමැතිව සියලුම සිත්වල යෙදෙන බැවින් මෙම චෛතසික හතට සර්ව චිත්ත සාධාරණ චෛතසික යයි කියනු ලැබේ. අකුසල හා කුසල චෛතසිකයන් දෙකේම යෙදෙන බැවින් මෙම චෛතසික අන්‍ය සමාන නම් වෙයි.

## ප්‍රකීර්ණක චෛතසික හය

විතක්ක, විචාර, අධිමෝක්ඛය, වීරිය, ප්‍රීතිය කියා හයකි.

අකුසල චෛතසික තුදුස (14)

මෝහය, අහිරිකය, අනොත්තප්පය, උද්දච්චය, ලෝභය, දිට්ඨිය, මානය, දෝසය, ඉස්සාව, මච්ජරිය, කුකුච්චය, ථීනය, මිද්ධය, විචිකිච්ඡාව යයි අකුසල චෛතසික 14 කි.

ශෝභන සාධාරණ එකුන් විස්ස (විස්සට එකක් අඩු එකුන් විස්ස)

ශ්‍රද්ධා, සති, හිරි, ඔත්තප්ප, අලෝභ, අදෝස, තත්‍රමජ්ඣත්තතා, කායපස්සද්ධි, චිත්තපස්සද්ධි, කායලහුතා, චිත්ත ලහුතා, කාය මුදුතා, චිත්ත මුදුතා, කාය කම්මඤ්ඤතා, චිත්ත කම්මඤ්ඤතා, කාය පාගුඤ්ඤතා, චිත්ත පාගුඤ්ඤතා, කායුජ්ජුකතා, චිත්තුජ්ජුකතා යනුවෙන් 19 කි.

මෙම චෛතසික දහනමය විශේෂයක් නොමැතිව සියලුම ශෝභන සිත්වල යෙදෙන බැවින් ශෝභන සාධාරණ නම් වෙති.

## ආසාධාරණ ශෝභන චෛතසික සය

සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන චෛතසික තුන කරුණු කොට ගෙන පව්කම්වලින් වළකින බැවින් එම චෛතසිකයෝ විරති නම් වෙති.

කරුණා මුදිතා යන චෛතසික දෙක අප්‍රමාණය නම් වෙයි.
වඩා හොඳින් ගැඹුරු ලෙස අරමුණු දක්නා බව ප්‍රඥා චෛතසිකයයි

මෙම චෛතසික විසි පහට $(19+6)$ ශෝභන චෛතසික යයි කියති.

සර්ව චිත්ත සාධාරණ චෛතසික හත විශේෂයක් නොමැතිව සියලු සිත්වල යෙදේ.
අහේතුක අකුසල විපාක වල චක්ඛු, ශෝක, ඝාන, ජිව්හා, කාය, විඤ්ඤාණාදී සිත් පසකි. කුසල විපාක සිත්වලද එම නම් වලින්ම විඤ්ඤාණ පසෙකි. ඒ සිත් දහයට ද්විපඤ්ච විඥාණ යන නාමය ව්‍යවහාර කරයි. මේ සිත් දහය (දුර්වල සිත් නිසා) ප්‍රකීර්ණක චෛතසික නොයෙදේ.

අකුසල් සිත් සියල්ලෙහිම යෙදෙන චෛතසික හතරකි. මෝහය, අහිරික (පවට ලජ්ජානැති) අනොත්තප්ප (පාපයට බිය නැති) උද්දච්ච (සිතෙහි විසිරුන බව) යන හතරයි.

ලෝභය ලෝභ මූල සිත් අටේ යෙදේ.

ශෝභන චෛතසික දහනමය සියලුම ශෝභන සිත්වල යෙදේ.

සර්වචිත්ත සාධාරණ චෛතසික හත, ප්‍රකිර්ණක හය, අකුසල් චෛතසික දාහතර කියා අකුසල් සිත්වල යෙදෙන චෛතසික විසිහතකි.

චෛතසික යෙදෙන සිත් වල විස්තර තවත් බොහෝය. පින්වතුනින් ඒ සඳහා රේරාකානේ චන්ද්‍රවිමල මහනාහිමිගේ අභිධර්ම මාර්ග පොත හා උන්වහන්සේගේම අභිධර්මයේ මූලික කරුණු යන පොත් කියවිය යුතුයි. පරමාර්ථ ධර්ම පිළිබඳව එම පොත්වල සියලු විස්තර ඇත.

## පට්ඨාන දේශනා සම්බන්ධ පොත්පත් ලබා ගැනීමට

පට්ඨාන ධර්ම සභාව, මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත, නාරාහේන්පිට, කොළඹ 05
දුරකථන අංක - 0112 580417
නාරාහේන්පිට ජාතික පොළ පාරේ ටික දුරක් යන විට පට්ඨාන ධර්ම සභාව වෙත යා හැකිය.

මහා පට්ඨාන ප්‍රකරණ ධර්මය ආදී ග්‍රන්ථ (පූජ්‍ය තපෝවනයේ රතන හිමිපාණෝ, මිණිපුර අමාශාන්ති තපෝවනය, පැල්වාඩිය, රත්නපුර. දු.අං - 045 2229458

පරමාර්ථ ධර්ම අතර රූපයද අප දැනගත යුතුය.

රූපය සෑදී ඇත්තේ කොටස් විසි අටක එකතුවෙනි. පඨවි ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යනුවෙන් භූත රූප හතරකි.

චක්ෂුඃ ප්‍රසාද, ශ්‍රෝත ප්‍රසාදය, ඝ්‍රාණ ප්‍රසාදය, ජිහ්වා ප්‍රසාදය, කාය ප්‍රසාදය යනුවෙන් ප්‍රසාද රූප පසකි.

රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍යය කිය, ගෝචර රූප 5 කි. ස්ත්‍රී භාව රූපය, පුරුෂ භාව රූපය කියා භාව රූප දෙකකි. හෘද රූපය, ජීවිත රූපය, ආහාර රූපය කියා නිෂ්පන්න රූප දහ අටකි. මේවා කර්මය නිසා හටගත් රූපවෙයි. ආකාශ ධාතුව, කාය විඤ්ඤාන්තිය, වචී විඤ්ඤත්තිය, ලහුතාව, මුදුතාව, කම්මඤ්ඤතා, උපචය, සන්තති, ජරතා අනිච්චාවතා කියා අනිෂ්පන්න රූප දහයකි. නිෂ්පන්න රූප දහ අට ගනන් කරන විට ස්ප්‍රස්ටව්‍යය අතහැර ගනන් කළ යුතු යයි අභිධර්ම මාර්ගයේ ඇත. රූප වලින් ප්‍රධාන වන්නේ භූත රූප හතරය. ඉතිරි රූප විසිහතර භූත රූප නිසා ඇති වන ඒවාය. ඒ නිසා ඒවාට උපාදාය රූප නාමය කියනු ලැබේ.

මහා භූත සතරය වර්ණ, ගන්ධ, රස, ඕජා යන උපාදාය රූප හතරය ජීවිත රූපයය ස්ත්‍රී භාව රූපය යන රූප පිණ්ඩයට ස්ත්‍රීභාව දශක කලාපය යැයි කියනු ලැබේ.

පුරුෂ භාව දශක කලාපයද ශුද්ධාශ්ඨක අටට ජීවිත රූපය හා පුරුෂ භාව රූපය යන රූප පිණ්ඩයට පුරුෂ භාව දශක කලාපය යයි කියනු ලැබේ.

චක්ඛු, ශ්‍රෝත, ඝාණ, ජිහ්වා, කාය විඤ්ඤාණ එම ප්‍රසාද පස ඇසුරු කරගෙන උපදී.

මනෝ ධාතුව හා මනෝ විඤ්ඤාණ ධාතුව හෘදය වස්තු රූපය ඇසුරින් උපදී.

සත්වයෙකු උපදින කල්හි ප්‍රතිසන්ධි චිත්තය සමග මහාභූත හතර හා වර්ණ, ගන්ධ, රස, ඕජා රූප සතරද ජීවිත රූපයද සමග හෘදය වස්තු රූපයද පහළවෙයි. එයට වස්තු දශක කලාපය යයි කියනු ලැබේ.

රූප කර්මාදී ප්‍රත්‍ය නිසා උපදින බැවින් සංඛත නම් වේ. කාම තණ්හාවට විෂය වන බැවින් කාමාවචර නම් වෙයි. අරමුණු නොගන්නා බැවින් අනාරම්මන නම් වෙයි.

තමා හා බැඳී උපදනා රූපයන් පරම්පරා වශයෙන් චිර කාලයක් පවත්වා පරිදි ජීවත් කරවන රූපය ජිවිතින්ද්‍රිය නම් වේ. ශරීරයක කර්මය චිත්තය, ඍතුවය, ආහාරය යන හේතු හතරෙන් හටගන්නා රූප ඇත්තේය. ඉන් චිත්ත, ඍතු, ආහාර යන හේතු තුන ඒවායින් උපදවන රූප ළඟම ඇත්තේය. සත්ව සන්තානයේ කර්මජ රූප හටගන්නේ ඒ අවස්ථාවට නැති අතීතයේ ඇතිවුනු කර්මයක් නිසාය. ඒ නිසා කර්මජ රූපවලට චිර කාලයක් පැවතිය හැකි ලෙස ආරක්ෂා කරන බලය ලබාදෙන්නේ ජිවිතින්ද්‍රිය රූපයයි. මේ ජීවිතින්ද්‍රිය නිසා කර්මජ රූප වර්ෂ දහස් ගණන් මුළුල්ලෙහි නොසිඳී පවතියි.

## ආහාර රූපය

සත්වයෝ තම ශරීර වලට ගැළපෙන ආහාර අනුභව කරති. ඒවායේ ඕජාවෙන් ඔවුන්ගේ ශරීර රැකෙයි. ආහාරයෙහි ඕජාව ආහාර රූපය නමින් හැඳින්වෙයි.

මෙම රූප කොටස් දහඅට කර්මාදී ප්‍රත්‍යයන් විසින් උපදවන රූප වන්නේය.

## චිත්තයේ ප්‍රභේද

චිත්තයේ ප්‍රභේද රාශියකි. අභිධර්මය ඉගෙන ගන්නා අයට වැදගත් වන ප්‍රභේද කිහිපයක් පමණක් මෙහි දක්වමි.

පුද්ගලයෙකු භවයේ උපදින විට ඔහුගේ අතීත භවයේ මරණාසන්න චිත්තයන්ට අරමුණු වූ කර්මය, කර්ම නිමිත්ත, ගති නිමිත්ත යන නිමිති තුන අතරින් එක දෙයක් අරමුණු කොට භවයේ පළමුවන සිත අතීත කර්මයක විපාක වශයෙන් උපදී. අභිනව භවයෙහි පළමු කොට උපදනා ඒ සිත අතීත භවය හා වර්තමාන භවය සම්බන්ධ කරන බැවින් එයට 'ප්‍රතිසන්ධි චිත්තය' යන නම කියනු ලැබේ.

චිත්තයේ ආයුෂ ඉතා කෙටි බැවින් එය සැණෙකින් බිඳෙන්නේය. ප්‍රතිසන්ධි සිත නිරුද්ධ වීමත් සමග ඒ ප්‍රතිසන්ධි චිත්තයෙන් ගත් අරමුණම ගෙන ප්‍රතිසන්ධි සිතට සමාන වූ තවත් සිතක් එතැනට පැමිණේ. මෙසේ ඒ සිත් පරම්පරාව වෙනත් සිතක් උපදනා තෙක්ම පවතියි. නාම රූප ධර්ම නොසිඳී පැවැත්වීමට ප්‍රතිසන්ධි චිත්තයෙන් පටන් ගත් ඒ චිත්ත පරම්පරාව භවාංග චිත්තය උපකාර වන්නේය. රූපාදී අරමුණු හමුවන විට ඒ භවාංග චිත්තයෙන් ම සිත් පහළ වෙයි. සිත් නූපදින අවස්ථාවලදී භවාංග චිත්ත පරම්පරාව නොසිඳී පවතියි. මේ නිසා ඒ භවාංග චිත්තයට මූල චිත්තය ප්‍රකෘති චිත්තය යයිද කියනු ලැබේ. නොයෙක් කරුණු පිළිබඳව උපදනා වීථි චිත්තයන්ගේ උප්පත්තියට හේතුවන බැවින් එයට '<u>මනෝද්වාරය</u>' යනුවෙන්ද කියනු ලැබේ. රූප ශබ්ද ආදී සකලාරම්මණයන්ගේම ඡායා භවාංග චිත්තයෙහි ස්පර්ශ වුනේ නැතිනම් ඇසීම, දැනීම වැනි සිත් පහළ නොවෙයි. සිත් පහළ වෙන්නේ භවාංග චිත්තයෙහි අරමුණු ගැටුනු විටය. භවාංග චිත්තයෙහි අරමුණු ගැටීම හා හඳුනාගැනීම පඤ්චද්වාරානුසාරයෙන් සිදුවෙයි.

පින්වතුනි චිත්ත විභාගයේදී අපි දැන ගත්තා සිත් 89 ක් තිබෙනවා කියලා. මේ සිත් 89 කොටස් තුනකට බෙදන්න පුළුවන්.

මනෝධාතු, විඤ්ඤාණධාතු, මනෝ විඤ්ඤාණධාතු

**සිත් 89** →
- **මනෝධාතු**
- **විඤ්ඤාණධාතු**
- **මනෝ විඤ්ඤාණධාතු**

**මනෝ ධාතුව කොටස් තුනකි.**

පඤ්චද්වාරාවර්ජන සිත 1
සම්පටිච්ඡන සිත් දෙක 2

පංචද්වාරාවර්ජනය යනු ඇස, කන, දිව, නාසය ශරීරය (චක්ඛු, සෝත, ඝාන, ජිව්හා කාය) යන මේ සිත් හටගැනීමට උපකාර වන්නාවූ දොරටු පහෙන් කුමන දොරටුවකින් යම් අරමුණක් පැමිණෙන්නේද යන්න සලකා බලන සිහිකරන ආවර්ජනය කරන සිතයි.

කෘමිසතුන් අල්ලා ගැනීමට දැලක් බඳින මකුළුවා නූල් සියල්ල එකට එකතු වෙන තැන සිටිනවා. සතෙකු දැලෙහි පැටළුන විට මකුළුවා එම සතා පැටළුනේ කුමන දිශාවෙන්දැයි දැනගෙන ඒ දිශාවට ගොස් සතාව අල්ලා ගන්නවා. ඒ වගේ ඇස කන ආදී ද්වාර පහෙන් කුමන දොරටුවකට ආරම්මණය පැමිණියේද යන්න සලකා බලන ආවර්ජනය කරන සිත පඤ්චද්වාරාවර්ජන සිතයි.

සම්පටිච්ඡන සිත් යනු පඤ්චද්වාරාවර්ජන සිතට පසුව ඇතිවන චක්ඛු විඤ්ඤාණයෙන් හඳුනාගත් අරමුණු පිළිගන්නා සිත්ය. එවැනි සම්පටිච්ඡන සිත් දෙකක් තිබෙනවා. එනම් අහේතුක අකුසල විපාක උපේක්ඛා සහගත සම්පටිච්ඡන සිත හා අහේතුක කුසල විපාක උපේක්ඛා සහගත සම්පටිච්ඡන සිතයි.

මේ පඤ්චද්වාරාවර්ජන සිතත් සම්පටිච්ඡන සිත් දෙකත් යන සිත් තුන මනෝධාතු වශයෙන් හැඳින්වෙනවා.

**විඤ්ඤාණ ධාතු** - මේ නමින් හැඳින්වෙන්නේ දෙපස් විඤ්ඤාණ සිත් දහයයි.

අහේතුක සිත් 18 හි අහේතුක අකුසල විපාක සිත් හතක්ද (7) අහේතුක කුසල විපාක සිත් අටක්ද ඇත.

## අකුසල විපාක සිත් 8 න්

අහේතුක අකුසල විපාක උපේක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය
අහේතුක අකුසල විපාක උපේක්ඛා සහගත ශ්‍රෝත විඤ්ඤාණය
අහේතුක අකුසල විපාක උපේක්ඛා සහගත ඝාණ විඤ්ඤාණය
අහේතුක අකුසල විපාක උපේක්ඛා සහගත ජිව්හා විඤ්ඤාණය
දුක්ඛ සහගත කාය විඤ්ඤාණය යන සිත් පහද අහේතුක කුසල විපාක සිත් අතරින් පහක්ද

අහේතුක කුසල විපාක උපේක්ඛා සහගත චක්ඛු විඤ්ඤාණය
අහේතුක කුසල විපාක උපේක්ඛා සහගත ශෝත්‍ර විඤ්ඤාණය
අහේතුක කුසල විපාක උපේක්ඛා සහගත ඝාන විඤ්ඤාණය
අහේතුක කුසල විපාක උපේක්ඛා සහගත ජිහ්වා විඤ්ඤාණය
සුඛ සහගත කාය විඤ්ඤාණය යන සිත් දහය ද්විපඤ්ච විඤ්ඤාණය නැතිනම් දෙපස් විඤ්ඤාණය ධාතු ලෙස හැඳින්වෙනවා.

**මනෝ විඤ්ඤාණ ධාතු**

මනෝ ධාතු සිත් 3 තුනකි
විඤ්ඤාණ ධාතු සිත් 10 කි.
මනො විඤ්ඤාණ ධාතු 76 කි.
සිත් අසූනමය 89 - 13 = 76 කි.

## <u>චිත්ත වීථි</u>

දැනීම, ඇසීම, අවයව ක්‍රියාකිරීම ආදී වූ කුමන ක්‍රියාවක් හෝ කිරීම එක සිතකින් සිදු නොවේ. එහිදී ඒ ඒ ක්‍රියා සිදුවීමට සිත් පරම්පරාවක් නැතිනම් සිත් පෙළක් හටගනියි. එම සිත් වැල් වලට 'චිත්ත වීථිය' යයි කියනු ලැබේ. චිත්ත වීථි ඉගෙන ගැනීමට අප මුලින්ම කළ යුත්තේ සිත්වල හා රූපවල ආයුෂ දැනගැනීමය. උපදනා කාලය පවත්නා කාලය නැසෙන කාලය කියා සිත්වලට හා රූප වලට අවස්ථා තුනක් ඇත. ඒ කාල ඉතාම කෙටි බැවින් ක්ෂණ යන නාමය කියනු ලැබේ. උපදනා කාලයට උත්පාදක්ෂණය කියාද පවත්නා කාලයට ස්ථිතික්ෂණය කියාද නැසෙන කාලයට භංගක්ෂණය කියාද කියනු ලැබේ. සිතෙහි මේ අවස්ථා තුනටම එකතු කොට චිත්තක්ෂණය යනුවෙන් සිතක කාලය දක්වා ඇත.

චිත්තක්ෂණය ඇසිපිය හෙළන කාලයෙන් ලක්ෂයෙන් පංගුවකටත් වඩා අඩුලු. රූපයකට චිත්තක්ෂණය දාහතක ආයු ඇත. එය කුඩා ක්ෂණ පනස් එකකි. එහි පළමු ක්ෂණය රූපයේ උත්පාද ක්ෂණයයි. පනස් එක්වන ක්ෂණය භංගක්ෂණයයි. මැද ක්ෂණ හතළිස් නමය (49) රූපයේ ස්ථිතික්ෂණයයි. අබ ඇටයක වුවද රූප කලාප රාශියකි. එහි රූප කලාප සියල්ල එකවර බිඳෙන්නේ නැත. බිඳෙන රූප කලාප වලට වරින් වර රූප කලාප එකතු වෙති. අපේ රූප කලාප වලටද පළමු ක්ෂණයේ දෙවන තුන්වන හතරවන ක්ෂණවල රූප කලාප රාශි වශයෙන් ඇත. එවා චිත්තක්ෂණ දාහත පිරී එක වර නොබිදෙන නිසා පෙර පැවති රූපයම අප තුළ පවතිනවා යයි අපි සිතා සිටින්නෙමු. චිත්ත වීථි ඇතිවන්නේ එක වස්තුවක වයසින් සමාන වූ රූප සමූහයක් අරමුණු කරගෙනය.

වීථි වනාහි පඤ්චද්වාර වීථි මනෝද්වාර වීථි වශයෙන් දෙකොටසකි. පඤ්චද්වාර වීථීහු ද චක්ෂු ද්වාර වීථි ශ්‍රෝත ද්වාර වීථි යනාදි වශයෙන් පස් කොටසක් වෙති. මේ එක් චක්ෂු ද්වාර වීථියක්ද අති මහන්තාරම්මන, මහන්තාරම්මණ, පරිත්තාරම්මණ, අති පරිත්තාරම්මණ වීථි යයි සතරකි. <u>චක්ෂුර්ද්වාරික අතිමහන්තාරම්මණ වීථියක් සලකා බලමු.</u>

චිත්ත වීථි ලෙහෙසියෙන් සිතට ගත හැකි වීමට වීථි සටහන ගැන දැනගත යුතුය. වීථි සටහන දැක්වීමේදී සිතෙහි උත්පාද, ස්ථිති, භංග යන ක්ෂණ තුන දැක්වීමට බින්දු තුනක් යොදති ඒ බින්දු වලට උඩින් එක් අකුරකින් සිත්වල නම් සටහන් කරති. සිත් හැඳින්වීමට යොදන අකුරු මෙසේය.

| | | |
|---|---|---|
| **අතීත භවාංග** | = | **තී** |
| **භවාංග චලන** | = | **න** |
| **භවාංගුපච්ඡේද** | = | **ද** |
| **පඤ්චද්වාරාවජ්ජන** | = | **ප** |
| **චක්ඛු විඤ්ඤාණ** | = | **ච** |
| **සම්පටිච්ඡන** | = | **සං** |
| **සන්තීරණ** | = | **ණ** |
| **වොත්ථපන** | = | **වො** |
| **ජවන** | = | **ජ** |
| **තදාරම්මණ** | = | **ත** |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **තී** | **න** | **ද** | **ප** | **ච** | **සං** | **ණ** | **වො** | **ජ** |
| ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ජ** | **ජ** | **ජ** | **ජ** | **ජ** | **ජ** | **ත** | **ත** | **භ** |
| ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | ooo | |
| 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | |

ඉපිද එක් චිත්තක්ෂණයක් ගතවූ රූපයක් චක්ෂු ප්‍රසාදයෙහි ගැටුණු විට එකෙණෙහිම එය හෘදය වස්තුවෙහි පවත්නා භවාංග චිත්තය සෙලවෙයි.

කෙනෙකු මිය යන අවස්ථාවේ ඔහුට ඔහු කළ කර්මයක් හෝ කර්ම නිමිත්තක් හෝ ගති නිමිත්තක් සිහිවෙයි. එය අරමුණු කොටගෙන දෙවන ජාතියේ පළමු සිත ''ප්‍රසිසන්ධි සිත' පහළ වෙයි. ප්‍රතිසන්ධි චිත්තය නිරුද්ධ වූ පසු මරණාසන්න චිත්තයට අරමුණු වූ දෙය අරමුණු කරන ප්‍රතිසන්ධි චිත්තයට සමාන සිතක් මරණය තෙක්ම නැවත නැවත ඇති වේ. එම සිත් භවයේ පැවැත්මට කාරණය වන බැවින් ඒ සිත්වලට භවාංග සිත් යයි කියනු ලැබේ.

ඉපිද එක් චිත්තක්ෂණයක් ගතවූ රූපයක් චක්ෂු ප්‍රසාදයෙහි ගැටුණහොත් එකෙණෙහිම එය හෘදය වස්තුවෙහි පවත්නා භවාංග චිත්තය ඒ අවස්ථාවේ සෙලවීමක් වැනි දෙයක් ඇතිවෙයි. එනිසා ඒ මොහොතේ භවාංග චිත්තය නිරුද්ධ වීම නිසා ඒ භවාංග චිත්තය භවාංග චලන යන නාමයෙන් හඳුන්වනු ලැබේ. ඉන්පසු රූපාරම්මණයේ ගැටීම ලබමින් උපදනා භවාංග චිත්තයෙන් භවාංග පරම්පරාව සිඳී යන බැවින් ඒ සිතට භවාංගුපච්ඡේදය යයි නම් කරයි. මෙම වීථිය කට පාඩම් කරගන්න.

මෙම වීථිය යටින් 17 දක්වා අංක යොදා ඇත්තේ රූපයේ ආයුෂ වන චිත්තක්ෂණ සතළොස දැක්වීමටය. මෙහි අංක 1, 2, 3 අංක තුනම භවාංග සිත්ය. ඒවායින් ප්‍රසාදයෙහි ගැටුණු රූප අරමුණු නොකරනු ලැබේ. ඉපිද එක් චිත්තක්ෂණයක් ඉක්මගිය රූපය ප්‍රසාදයෙහි ගැටුනේ භවාංග චලනයේ උත්පාදක්ෂණය තුළදීය. ඒ රූපය අරමුණු කොට පළමුවෙන් ඇතිවන චිත්තය පඤ්චද්වාරා වජ්ජනයයි.

පංචද්වාරාවජ්ජනයේ සිට දෙවන තදාරම්මණය දක්වා ඇති සිත් (14) දාහතර ප්‍රසාදයෙහි ගැටුණු රූපය අරමුණු කොට උපදනා සිත්ය පංචද්වාරාවජ්ජනයෙන් කෙරෙන්නේ සිත් පරම්පරාව රූපාරම්මණය දෙසට හැරවීමය. එවිට රූපය චක්ඛු විඤ්ඤාණයට යොමු වෙයි. වර්ණමාත්‍රය දැක චක්ඛු විඤ්ඤාණය නිරුද්ධ වෙයි. ඒ සමගම සම්පටිච්ඡන සිත එම රූපාදී අරමුණ පිළිගනියි. එසැනින් ඒ සිත නිරුද්ධවත්ම සන්තීරණ සිත එම අරමුණ විමසා නිරුද්ධ වෙයි. විමසූ අරමුණේ තතු විනිශ්චය කිරීම වොත්ථපනයෙන් සිදුවෙයි. මෙසේ විනිශ්චය කරනු ලැබූ රූපය ඉතා හොඳින් දැන ගන්නා වූ එහි රසය විඳින්නාවූ බලවත් සිතක් පිළිවෙළින් සත්වරක්ම පහළ වෙයි. ඒ චිත්තයට ජ වන චිත්තයයි කියනු ලැබේ. රූපය දැකීම සම්පූර්ණ වන්නේ ජවන චිත්තයෙනි. මේ ජවන අතර බලවත් ජවනයෝද දුර්වල ජවනයෝද ඇත. සත්වයන් විසින් සිදු කරන අනේක ප්‍රකාර ක්‍රියා සිදුවන්නේ ඒ ජවන සිත් වලිනි. පින් පව් සිදුකරන්නේද ජවහ චිත්තයයි.

පින්වතුනි මෙහි කොතෙකුත් අඩුපාඩු තිබෙන්න පුළුවන්. පට්ඨාන දේශනා අසත්ම අසත්ම මට ඒ පිළිබඳව වැඩිදුර දැන ගැනීම පිළිබඳ පිපාසයක් ඇතිවුනා. මම කියවූ පොත් ලබාගත් ස්ථාන පවා සඳහන් කර ඇති. මට හිතුනා මට වගේම එම ධර්මය පිළිබඳව ධර්ම පිපාසයෙන් පෙළෙන ධර්මකාමීන් බොහෝ පිරිසක් ඇති බවක්. පට්ඨාන ධර්මයේ චිරස්ථිථිය පිණිසම මාගේ මේ උත්සාහය හේතු වේවා. මාගේ භාග්‍යවතුන් වහන්සේගේ 'සූවිසි ප්‍රත්‍ය' ඥානය සහිත අචින්ත්‍ය වූ ගුණ සමුදායට අකාලික වූ ධර්ම රත්නයට සුපටිපන්නවූ සංඝ රත්නයට මේ අසරණ මිඩියගේ ධර්ම පූජාව උපහාරයක්ම වේවා.

**- පට්ඨාන ධම්මෝ චිරං තිට්ඨතු -**